# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,504 - 2026 අගෝස්තු මස 28 සිකුරාදා - 2026.08.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... ... | - |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 සැප්තැම්බර් මස 18 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 සැප්තැම්බර් මස 04 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඊ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

*සැ. යු. :*"මින්පෙර පළ වූ ගැසට් නිවේදන සියල්ලෙහි ම සඳහන් විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් යන මැයෙන් පළකරනු ලැබූ නීති හා උපදෙස් මාලාව මෙමගින් අවලංගු කරනු ලබන අතර මින් ඉදිරියේ දී බලපවත්වනු ලබන්නේ මෙම ගැසට් පත්‍රයේ පළකරනු ලබන නීති හා උපදෙස් මාලාවයි."

2026 ජූලි මස 22 වැනි දින,
ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්.

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඵ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය)

දෙමළ මාධ්‍යය

**රෙජිස්ට්‍රාර් තනතුරු බදුල්ල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 සැප්තැම්බර් මස 28 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 අගෝස්තු මස 17 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | මීගහකිවුල | මීගහකිවුල කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ මීගහකිවුල කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |
| බදුල්ල | බණ්ඩාරවෙල | බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |

08 - 292

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

**බදුල්ල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.
රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර්ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026 සැප්තැම්බර් මස 28 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 අගෝස්තු මස 13 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | වැලිමඩ | ගුරුතලාව කොට්ඨාසයේ උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |

08 - 293

## ශ්‍රී ලංකා පොලීසිය

### උප සේවා සහකාර පොලිස් අධිකාරි තනතුර (පිරිමි/ කාන්තා) (උප සේවා යටතේ සහ ද්විතීයන පදනම මත)

ශ්‍රී ලංකා පොලීසියට උපසේවා යටතේ සහ ද්විතීයන පදනම මත (රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින්ගෙන්) ආධුනික සහකාර පොලිස් අධිකාරි (පිරිමි/ කාන්තා) පහත තනතුරුවලට බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

a) තොරතුරු තාක්ෂණ තනතුර
b) වාස්තු විද්‍යාඥ තනතුර
c) ගෘහ නිර්මාණ ශිල්පි තනතුර
d) විදුලි ඉංජිනේරු තනතුර
e) සිවිල් ඉංජිනේරු තනතුර
f) විදුලි සංදේශ ඉංජිනේරු තනතුර

02. www.police.lk වෙබ් අඩවියට පිවිස " join us" විකල්පය තෝරා ගැනීමෙන් (Click කිරීමෙන්) හෝ පහත සඳහන් QR කේතය ස්කෑන් (Scan) කිරීමෙන් අයදුම්පත වෙත ඇතුළත් වී මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණක් අයදුම්පත් සම්පූර්ණ කර 2026 සැප්තැම්බර් මස 30 දිනට පෙර යොමුකළ යුතු අතර, කිසිදු අයදුම්පතක් තැපැල් මගින් යොමු නොකළ යුතු ය. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමුකල අයදුම්පතේ පිටපතක් මූලික පරීක්ෂණය සඳහා පැමිණීමේ දී අයදුම්කරු/ අයදුම්කාරිය විසින් රැගෙන පැමිණිය යුතු ය. (පිටපතේ අයදුම්කරු/ අයදුම්කාරිය විසින් තම අත්සන යොදා තිබිය යුතු ය.)

03. අයදුම්පත් යොමුකිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් වෙතොත් අයදුම්කරු විසින් විඳදරාගත යුතු ය.

(අ) මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් පවතීනම් සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය.

(ආ) සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පත්වීම පිරිනැමීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලබයි.

(ඇ) මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මා විසින් තීරණයකරනු ඇත.

(ඈ) තනතුරෙහි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම *ගැසට්* නිවේදනය අවලංගු වේ.

(ඉ) අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

04. වැටුප් ක්‍රමය :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් ක්‍රමය රු. 82,150 – 10 x 2,400 – 8 x 2,940 – 17 x 3,900 – රු. 195,970/- ක් වේ.
වැටුප් කේතය - SL 1 – 2025

චක්‍ර ලේඛයේ උපලේඛන III පරිදි 2026 වර්ෂය සඳහා ගෙවන කොටස රු. 74,438/- ක් වේ.
2027.01.01 දිනට ගෙවන මුදල රු. 82,150/- ක් වේ.

(අ) මූලික වැටුපෙන් 22% + රු. 1,250/- ක දීමනාව
(ආ) විධායක දීමනාව (රා.ප.ච.අංක 18/2015(V) අනුව)
(ඇ) දුෂ්කර දීමනාව රු. 2,000.00
(ඈ) ජීවන වියදම් දීමනාව රු. 17,800.00
(ඉ) ආහාර හා නවාතැන් දීමනාව රු. 34,800.00
(පොලිස්පති චක්‍රලේඛ අංක 2773/2024 අනුව)

**05. මූලික සුදුසුකම් :**

**5.1 අධ්‍යාපන සුදුසුකම් :**

**තොරතුරු තාක්ෂණ තනතුර :**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක පරිගණක විද්‍යාව හෝ පරිගණක විද්‍යාව විෂයයක් ලෙස සමත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම;

*හෝ*

(ii) ඉහත (i) හි සඳහන් උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යයන අවශ්‍යතා සම්පූර්ණ කර ඊට අදාල වලංගු සහතික ලබා තිබීම.

**වාස්තු විද්‍යාඥ තනතුර / ගෘහ නිර්මාණ ශිල්පි තනතුර**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ වරලත් වාස්තු විද්‍යාඥයින්ගේ සංගමය විසින් පිළිගනු ලැබ ඇති විශ්වවිද්‍යාලයකින් වසර 04ක පූර්ණ කාලීන වාස්තු විද්‍යාඥ උපාධියක් ලබා තිබීම;

*හෝ*

(ii) ඉහත (i) හි සඳහන් උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ වරලත් වාස්තු විද්‍යාඥයින්ගේ සංගමය විසින් පිළිගනු ලැබූ අධ්‍යයන අවශ්‍යතා සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතික ලබා තිබීම.

**විදුලි ඉංජිනේරු තනතුර :**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති විශ්වවිද්‍යාලයකින් වසර 04 ක පූර්ණ කාලීන විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම;

*හෝ*

(ii) ඉහත (i) හි සඳහන් උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබූ අධ්‍යයන අවශ්‍යතා සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතික ලබා තිබීම.

**සිවිල් ඉංජිනේරු තනතුර :**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති විශ්වවිද්‍යාලයකින් වසර 04ක පූර්ණ කාලීන සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම;

*හෝ*

(ii) ඉහත (i) හි සඳහන් උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබූ අධ්‍යයන අවශ්‍යතා සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතික ලබා තිබීම.

**විදුලි සංදේශ ඉංජිනේරු තනතුර :**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති විශ්වවිද්‍යාලයකින් වසර 04 ක පූර්ණ කාලීන විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම;

*හෝ*

(ii) ඉහත (i) හි සඳහන් උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබූ අධ්‍යයන අවශ්‍යතා සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතික ලබා තිබීම.

**5:2 වෘත්තිය සුදුසුකම් :**

**විදුලි ඉංජිනේරු /** සිවිල් ඉංජිනේරු තනතුර/ **විදුලි සංදේශ ඉංජිනේරු තනතුර**

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය (Associated Membership) ලබා තිබීම හෝ පූර්ණ සාමාජිකත්වය ( Corperate Membership ) ලබා තිබීම.

**තොරතුරු තාක්ෂණ තනතුර :**

පරිගණක මෘදුකාංග හෝ පරිගණක දත්ත පද්ධති හෝ පරිගණක ජාල පද්ධති හෝ පරිගණක ව්‍යවහාරික හෝ යන විෂයය ක්ෂේත්‍රයන්ගෙන් එක් ක්ෂේත්‍රයකට අදාළව පරිගණක ඉංජිනේරුවරයෙකු ලෙස කටයුතු කිරීම.

**වාස්තු විද්‍යාඥ තනතුර / ගෘහ නිර්මාණ ශිල්පි තනතුර :**

වරලත් වාස්තු විද්‍යාඥයින්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය (Associated Membership) ලබා තිබීම හෝ පූර්ණ සාමාජිකත්වය (Corperate Membership ) ලබා තිබීම.

**5:3 වෘත්තිය පළපුරුද්ද :**

**විදුලි ඉංජිනේරු /** සිවිල් ඉංජිනේරු/ **වාස්තු විද්‍යාඥ / ගෘහ නිර්මාණ ශිල්පි** තනතුර /විදුලි සංදේශ ඉංජිනේරු තනතුර

උපාධිය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් තුන් අවුරුදු කාලයක් අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක සේවා පළපුරුද්ද.

**තොරතුරු තාක්ෂණ තනතුර :**

පරිගණක මෘදුකාංග හෝ පරිගණක දත්ත පද්ධති හෝ පරිගණක ජාල පද්ධති හෝ පරිගණක ව්‍යවහාරික හෝ යන විෂයය ක්ෂේත්‍රයන්ගෙන් එක් ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් ආයතනයක පරිගණක

ඉංජිනේරුවරයෙකු ලෙස අවම වශයෙන් වසර තුනක වෘත්තිය පළපුරුද්ද ලබා තිබීම.

**5:4 කායික සුදුසුකම් (සියලු තනතුරු සඳහා) :**

I. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සහ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

II. පිරිමි - උස අඩි 05 අඟල් 06 ට නොඅඩු විය යුතු අතර, පපුව හුස්ම නාල්ලා අඟල් 32ට නොඅඩු විය යුතු ය.
කාන්තා - අඩි 05 අඟල් 04 ට නොඅඩු විය යුතු ය.
(විශේෂ සුදුසුකම් සහ ප්‍රවීණතාවයන් සහිත අයදුම්කරුවන් සම්බන්ධයෙන් පොලිස්පතිගේ අභිමතය පරිදි මෙම උස සීමාවන් සහ පපුව අදාළ සීමාවන්ගෙන් අපගමනය විය හැක.)

III. දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් :-
උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච සහිතව හෝ රහිතව ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතර ද, වර්ණ පෙනීම සාමාන්‍ය ද විය යුතු ය.

**5:5 වෙනත් :**

5:5:1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු යි.

5:5:2 අයදුම්කරුවන්/අයදුම්කාරියන් ශ්‍රී ලංකා පොලිසිය අපේක්ෂිත විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

5:5:3 විවාහක හෝ අවිවාහක දෙපාර්ශ්වයටම අයදුම් කළ හැක.

5:5:4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

5.5.5 පිරිමි හෝ කාන්තා දෙපාර්ශ්වයටම අයදුම් කළ හැක.

5:5:6 කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතු ය. (උදා : පච්ච කොටා තිබීම)

5:5:7 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 5.1 සිට 5.6 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට්* පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**5:6 වයස :**
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 25 - 45 ත් අතර විය යුතු ය.

**06. බඳවා ගැනීමේ ක්‍රමය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු වල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල සහ පසුබිම් පරීක්ෂණයේදී යහපත් වාර්තා ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සහ වෛද්‍ය පරීක්ෂණය සමත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

**6.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-**

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01.අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | අදාළ නොවේ |
| 02. සේවා පළපුරුද්ද | 30 | |
| 03.අතිරේක භාෂා දැනුම හා පරිගණක හැකියාව | 20 | |
| 04.නායකත්වය / ප්‍රජා සේවාවන් | 10 | |
| 05.සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 10 | |
| **එකතුව** | **100** | |

**07. පසුබිම් පරීක්ෂණය :**

7.1. බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගේ / අයදුම්කාරියන්ගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා පසුබිම් පරීක්ෂණය පවත්වනු ලබයි.

7.2. අයදුම්කරුගේ / අයදුම්කාරියගේ යහපත් චරිතය තහවුරු කරගැනීම සඳහා ඔහු / ඇය හා ඔහුගේ / ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු / ඇය සමීපව ඇසුරු කරන්නන්ගේද යහපත් චරිතය, හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් පරීක්ෂණ වාර්තා සහිත අයදුම්කරුවන් / අයදුම්කාරියන් බඳවාගනු නොලැබේ.

***සටහන:-*** සමීප ඥාතීන් සම්බන්ධයෙන් අපරාධ වාර්තා කිසිවක් නොතිබිය යුතු ය. සමීප ඥාතීන් යනු, අයදුම්කරුගේ / අයදුම්කාරියගේ මව, පියා, භාරකරුවන්, සහෝදර සහෝදරියන් සහ සහෝදර සහෝදරියන් විවාහක නම් කලත්‍රයන් ද, අයදුම්කරු /

අයදුම්කාරිය විවාහක නම් කලත්‍රයන්, සමීප ඥාතීන් ලෙස සලකනු ලැබේ.

7.3 බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් / අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු / ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් ඕනෑම අවස්ථාවක දී පත්වීම අවසන් කරනු ලැබේ.

**08. වෛද්‍ය පරීක්ෂණ :**

වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන් / අයදුම්කාරියන්ට පොලිස් රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ඇතුළු වෛද්‍ය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. තව ද මෙහිදී අයදුම්කරුවන් / අයදුම්කාරියන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතා පරීක්ෂණයකට ද භාජනය කරනු ලැබේ. පොලිස් රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සෞඛ්‍ය 169 පෝරමය යටතේ ඉදිරිපත් කළ යුතු ය. වෛද්‍ය පරීක්ෂණය අසමත් වන අයදුම්කරුවන්ට සහ අයදුම්කාරියන්ට අභියාචනා ඉදිරිපත් කළ නොහැක.

**09. පුහුණුව :**

පසුබිම් පරීක්ෂණයෙන් සහ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් /අයදුම්කාරියන් අතරින් කුසලතා ලේඛනයට අනුව උපරිම ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අනුමත පුරප්පාඩු සංඛ්‍යාව අනුව පොලිස්පති විසින් නියම කරන ලද දිනයකදී පුහුණුව සඳහා කැඳවනු ලැබේ. මෙම පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේදී ලබා දෙනු ලැබේ.

**10. පත්වීමේ කොන්දේසි :**

**මෙම තනතුර** විශ්‍රාම වැටුප් රහිත ය. ඔබ රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලට දායක විය යුතු ය. ගෙවිය යුතු මුදල රජය විසින් කලින් කලට ප්‍රකාශ කරනු ලබන්නේය.

**11. සේවා කොන්දේසි :**

I. ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, ජාතික පොලිස් කොමිෂන් සභා, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, පොලිස් නියෝග, ශ්‍රී ලංකා පොලිසියේ අත්පොත්වල සහ උපදෙස් සංග්‍රහවල විධිවිධානවලට ද යටත් විය යුතු ය.

II. තනතුරට බඳවා ගන්නා සහකාර පොලිස් අධිකාරිවරුන්/ වරියන් ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව ක්‍රියාකරන බවට ප්‍රතිඥා/ දිවුරුම් දිය යුතු යි.

12. අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සුදු පසුබිමේ ලබාගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් හා පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් අයදුම්පත් සම්පූර්ණ කරන අවස්ථාවේ දී උඩුගත (Upload) කළ යුතු ය.

- (අ) උප්පැන්න සහතිකය
- (ආ) ජාතික හැඳුනුම්පත
- (ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
- (ඈ) වලංගු රියදුරු බලපත්‍රය
- (ඉ) වෘත්තිය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
- (ඊ) පලපුරුද්ද සනාථ කිරීම සඳහා වූ සහතික
- (උ) ඔබ රජයේ සේවයෙන් හෝ සන්නද්ධ සේවයෙන් ඉවත්ව ඇත්නම් ඉවත්වීමේ ලිපිය.

13. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන්/ අයදුම්කාරියන් ඔවුන්ගේ/ ඇයගේ අයදුම්පත යොමු කිරීමේ දී අයදුම්පතේ අනු අංක 18 යටතේ ඇති පහත ආකෘතියට අනුව සකස් කරන ලද ලිපියක් ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව උඩුගත (Upload) කළ යුතු ය.

| |
|---|
| මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................................. ............................................ මහතා ............................................ ................................................ දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ/ මණ්ඩලයේ/ යුධ හමුදා බලකායේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි. |
| .......................................... *ආයතන ප්‍රධානියාගේ අත්සන* *නම*................................. *නිල මුද්‍රාව.* |
| *දිනය* ................................ |

*සටහන -*

**පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට/ අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ගෙවනු නොලැබේ.**

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 02.

08 - 304

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

01. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් **2026 දෙසැම්බර් මස** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.doenets.lk** වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.09.25** දින වේ.

සටහන **- මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2026 අගෝස්තු මස 31 වන දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2026 සැප්තැම්බර් මස 25 වන දින ප.ව. 9.00ට අවසන් වේ.**

මෙම විභාගය උපලේඛනය - II හි දක්වා ඇති නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පවත්වනු ලැබේ. සියලු අයදුම්කරුවන් එම උපලේඛනයට අනුව විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තුවන නගරය තෝරාගත යුතු අතර මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා ඊට අදාළ නගර අංකය උපලේඛනය - II අනුව නිවැරදිව සඳහන් කළ යුතු ය.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත, කුසලතා අනුපිළිවෙළ අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

03.

(*අ*) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්කිරීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්කිරීම් බලධරයාට බලය ඇත.

*සටහන* **:-** මෙම බඳවා ගැනීම මගින් අධික පුරප්පාඩු ප්‍රතිශතයක් පවතින අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/කොමිෂන් සභාවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රමුඛතාව ලබා දෙන අතර මෙම තරග විභාගය සමත්ව පත්වීමක් සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් අනුයුක්ත කරනු ලබන සේවා ස්ථානයට රාජකාරි සඳහා වාර්තා කිරීමට බැඳී සිටී. පත්වීම් ලබා දීමෙන් අනතුරුව අනුයුක්ත කළ සේවා ස්ථානය සංශෝධනය සඳහා සිදු කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(*ආ*) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1840/34 සහ 2013.12.11 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියම හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(*ඇ*) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර තුනක් (03) අනිවාර්යයෙන්ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතු මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(*ඈ*) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(*ඉ*) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

04. 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 02-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය රු. 48,470 - 10x540 - 11x630 - 10x1,010 - 10x1,190 – රු. 82,800/- ක් වේ. පත්වීමක් සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවකුට එම වැටුප හිමිවන්නේ 2027.01.01 දින සිට වන අතර පත්වීම

ක්‍රියාත්මක වන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

05. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

06. සුදුසුකම් :

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2008.09.25 දින හෝ ඊට පෙර හා 1996.09.25 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(ඈ) සෑම අපේක්ෂකයකුම දේශයේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

(ඉ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

1. භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව **එක්වරකදී** විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සියලුම විෂයයන්ගෙන් **එකවර** සමත්ව තිබීම.

***සටහන -***

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු භාෂාව ලෙස සලකනු ලබන්නේ අයදුම්කරු මෙම තරග විභාගය සඳහා ඉදිරිපත්වන භාෂා මාධ්‍යය වේ.

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට සමාන, වෙනත් දේශීය හෝ විදේශීය අධ්‍යාපන ආයතන මඟින් පවත්වනු ලබන විභාගයකට පෙනී සිට ලබාගෙන ඇති සුදුසුකමක් පත්වීම ලබා දීම සඳහා අදාළ කර ගැනීම පිළිබඳ අවසන් තීරණය අදාළ අධ්‍යාපන ආයතනවලින් සහ විභාග කොමසාරිස් ජනරාල්වරයාගෙන් තහවුරු කර ගැනීමෙන් පසු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ගනු ලැබේ.

***සැලකිය යුතුයි* - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2026.09.25 දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

07. දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරා ගැනීම :

දිස්ත්‍රික් නාමලේඛනය, උපලේඛනය - I ලෙස දක්වා ඇත. අයදුම්කරුවන් විසින් තමා පුරප්පාඩු සඳහා තරග කිරීමට තෝරාගනු ලබන දිස්ත්‍රික්කය හා එහි අංකය උපලේඛනය - I අනුව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේදී නිවැරදිව සඳහන් කළ යුතු ය.

(අ) සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

I. යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා අයදුම් කර සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවලදී එම පුරප්පාඩු සංඛ්‍යාව යාබද සියලු දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදා හරිනු ලැබේ.

II. පිරවීමට නියමිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව ස්වල්පයක් නම්, එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාළ කර ගත නොහැකි වන විට කුසලතා අනුපිළිවෙළින් සුදුස්සන් තෝරනු ලැබේ.

III. විභාගයේ දී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව වෙන් කළ පුරප්පාඩු

සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

*සැලකිය යුතුයි* - **දිස්ත්‍රික්කයකට වෙන් කළ පුරප්පාඩු ගණන යන්නෙන් අදහස් වන්නේ එම පරිපාලන දිස්ත්‍රික්කයේ ජනගහනයට අනුපාතිකව එම දිස්ත්‍රික්කයෙන් තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සඳහා වෙන් කරන පුරප්පාඩු සංඛ්‍යාව වන අතර එම පරිපාලන දිස්ත්‍රික්කය තුළ පවතින රාජ්‍ය ආයතනවල ඇති සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව නොවන බව සැලකිය යුතු වේ.**

(*ආ*) දිස්ත්‍රික්කයට අයත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම් - දිස්ත්‍රික්කයකට වෙන් කළ පුරප්පාඩු සඳහා තරග කිරීමට නම් පහත සඳහන් කරුණු අතරින් එකක් හෝ සපුරා තිබිය යුතු ය.

I. අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ ඉපදුණු අයකු විය යුතු ය;

*එසේ නැතහොත්*

II. විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (03) වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයකු විය යුතු ය;

*එසේ නැතහොත්*

III. ඔහු නොකඩවා අවුරුදු 05 ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීයික පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතු ය.

*සටහන -*

1. ලිඛිත විභාගයෙන් තේරීපත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉහත දිස්ත්‍රික්කයට අයත් වීම සනාථ කෙරෙන පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.

I. උප්පැන්න සහතිකය
II. ග්‍රාම නිලධාරි සහතිකය සහ අවුරුදු තුනක (03) අඛණ්ඩ පදිංචිය තහවුරු කෙරෙන ඡන්ද හිමි නාමලේඛන
III. ශිෂ්‍ය කාර්ය දර්ශනය

2. යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම් එම අපේක්ෂකයාට, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ. (ඒ සඳහා අයදුම්කරු විසින් තම දෙමාපියන් උපන් ස්ථානය සහ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක සේවයක නිරත වන බව සනාථ කිරීම සඳහා අදාළ ලියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ යුතු ය.)

3. කිසිම අපේක්ෂකයකුට එක් දිස්ත්‍රික්කයකට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. මාර්ගගත අයදුම්පත යොමු කිරීමේ දී ඉහත 07(ආ) හි සඳහන් සුදුසුකම් අනුව තමන් පුරප්පාඩු සඳහා තරග කිරීමට දිස්ත්‍රික්කය තෝරාගත් පසු එය නැවත වෙනස් කළ නොහැක.

08. මෙම තරග විභාගය මගින් සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධිත අයදුම්කරුවන් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3%ක ප්‍රතිශතයක් පමණක් කුසලතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගැනෙනු ඇත. මේ සඳහා සුදුසුකම් ලැබීමට විභාගයේ එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක්වත් (40%) අපේක්ෂකයන් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබා ගත යුතු වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි විධිවිධාන ආබාධිත පදනමින් බඳවා ගැනීම සඳහා අදාළ වේ.

ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන්කෙරෙන පුරප්පාඩු සඳහා අයදුම් කර සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන්, සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට අමතරව වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ද ඉදිරිපත් කරනු ලබන අතර වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයේ දී ආබාධිත අයදුම්කරුවකු නොවන බවට හෝ ආබාධිත පදනම යටතේ පත්වීමක් ලබාදීමට සුදුසුකම් නොලබන බවට නිර්දේශ කරන අයදුම්කරුවන් පත්වීමක් සඳහා සුදුසුකම් නොලබන බව සැලකිය යුතු වේ.

*සටහන -* මෙම විභාගය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි විධිවිධාන අනුව විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවකු හෝ විභාගය පවත්වන අවස්ථාවේ දී යම් විශේෂිත පහසුකමක් සැලකිය යුතු අයදුම්කරුවකු ඉදිරිපත් වන්නේ නම් ඒ බව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී අනිවාර්යයෙන් සඳහන් කළ යුතු

අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත්, අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. **ආබාධිත නොවන අයකු සාවද්‍ය ලෙස ආබාධිත යැයි සඳහන් නොකළ යුතු ය.**

09. විභාග පරිපාටිය :-

(අ) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| | | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01 | භාෂා හැකියාව | 100 | පැය 02 1/2 |
| 02 | අභියෝග්‍යතාවය | 100 | පැය 01 |

(01) භාෂා හැකියාව :

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(02) අභියෝග්‍යතාවය :

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

***සටහන :-*** රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

(ආ) මෙම තරග විභාගය මඟින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක්වත් (40%) අපේක්ෂකයන් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබා ගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

(ඇ) විභාග ප්‍රතිඵල - ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාව මත, ලිඛිත විභාගයේ එක් එක් විෂයයට ලබා ගත් ලකුණු/මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ **www.results.exams.gov.lk** වෙබ් අඩවිය හරහා නිකුත් කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ඇත.

10. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

i. අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

ii. අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

11. විභාග කොන්දේසි

(i) මාර්ගගත (online) විභාග අයදුම්පත **ඉංග්‍රීසි භාෂාවෙන්** සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර, කියවා, අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපැදිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදුකළ යුතු ය.

(i.) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
(ii.) ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card)
(iii.) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/Flex යෙදවුම මගින්
(Bank of Ceylon Online Banking Method/ Flex App)
(iv.) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

*සටහන:* ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(iii) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් (E-mail) මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(iv) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

(v) අයදුම්පත් ඉදිරිපත් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතු ය.

(vi) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

(vii) අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් ද දැනුවත් කරනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, යොමු අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(viii) ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී හෝ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ix) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

(x) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

12. විභාගයට ඇතුළත් කර ගැනීම :

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම

එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(*ආ*) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළ කර ඇත.

*සටහන* **:- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.**

13. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛනයක් පමණක් භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

14. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

15. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

**එන්.යූ. නිශාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2026 අගෝස්තු මස 19 වන දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

## උපලේඛනය - I

### දිස්ත්‍රික් නාම ලේඛනය හා අංක

| *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික්ක අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

## උපලේඛනය - II

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර

| | *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| 01 | කොළඹ | කොටහේන | 01 |
| | | මරදාන | 02 |
| | | බොරැල්ල | 03 |
| | | කුරුඳුවත්ත | 04 |
| | | බම්බලපිටිය | 05 |
| | | හැව්ලොක් ටවුම | 06 |
| | | නුගේගොඩ | 07 |
| | | මොරටුව | 08 |
| | | පිළියන්දල | 09 |
| | | හෝමාගම | 10 |
| | | මහරගම | 11 |
| | | හංවැල්ල | 12 |
| | | අවිස්සාවේල්ල | 13 |
| 02 | ගම්පහ | මීගමුව | 14 |
| | | මිනුවන්ගොඩ | 15 |
| | | දිවුලපිටිය | 16 |
| | | වේයන්ගොඩ | 17 |
| | | ගම්පහ | 18 |
| | | ජාඇල | 19 |
| | | වත්තල | 20 |
| | | කැලණිය | 21 |
| | | දොම්පෙ | 22 |
| 03 | කළුතර | හොරණ | 23 |
| | | පානදුර | 24 |
| | | කළුතර | 25 |
| | | මතුගම | 26 |
| | | අලුත්ගම | 27 |
| 04 | මහනුවර | මහනුවර | 32 |
| | | කටුගස්තොට | 33 |
| | | තෙල්දෙණිය | 34 |
| | | වත්තේගම | 35 |
| | | නුගවෙල | 36 |
| | | ගලගෙදර | 37 |
| | | ගම්පොළ | 38 |
| 05 | මාතලේ | මාතලේ | 28 |
| | | ගලේවෙල | 29 |
| | | නාඋල | 30 |
| | | ලග්ගල - පල්ලේගම | 31 |
| 06 | නුවරඑළිය | හැඳුනුවැව | 39 |
| | | නුවරඑළිය | 40 |
| | | වතුමුල්ල | 41 |
| | | හැටන් | 42 |
| | | ගිනිගත්හේන | 43 |
| 07 | ගාල්ල | අම්බලන්ගොඩ | 44 |
| | | ගාල්ල | 45 |
| | | බද්දේගම | 46 |
| 08 | මාතර | වැලිගම | 47 |
| | | මාතර | 48 |
| | | කඹුරුපිටිය | 49 |
| | | හක්මන | 50 |
| | | දෙයියන්දර | 51 |
| | | දික්වැල්ල | 52 |
| | | අකුරැස්ස | 53 |
| | | කොටපොල | 54 |
| 09 | හම්බන්තොට | බෙලිඅත්ත | 55 |
| | | වලස්මුල්ල | 56 |
| | | වීරකැටිය | 57 |
| | | තංගල්ල | 58 |
| | | අම්බලන්තොට | 59 |

| | දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| | | හම්බන්තොට | 60 |
| | | තිස්සමහාරාමය | 61 |
| 10 | යාපනය | චාවකච්චේරිය | 62 |
| | | යාපනය | 63 |
| | | තෙලිප්පල්ලෙයි | 64 |
| | | පේදුරුතුඩුව | 65 |
| 11 | මන්නාරම | මන්නාරම | 66 |
| | | මුරුක්කන් | 67 |
| 12 | වවුනියාව | වවුනියාව | 69 |
| 13 | මුලතිව් | මුලතිව් | 68 |
| 14 | කිලිනොච්චිය | කිලිනොච්චිය | 124 |
| | | පලෙයි | 125 |
| 15 | මඩකලපුව | මඩකලපුව | 75 |
| | | එරාවූර් | 76 |
| | | කාතන්කුඩි | 77 |
| 16 | අම්පාර | අම්පාර | 78 |
| | | සේරංකඩ | 79 |
| | | කල්මුණේ | 80 |
| | | අක්කරපත්තු | 81 |
| | | සමන්තුරේ | 82 |
| 17 | ත්‍රිකුණාමලය | කන්තලේ | 70 |
| | | ත්‍රිකුණාමලය | 71 |
| | | මූතූර් | 72 |
| | | පදවි පරාක්‍රමපුර | 73 |
| | | කින්නියා | 74 |
| 18 | කුරුණෑගල | කුලියාපිටිය | 87 |

| | දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| | | බිංගිරිය | 88 |
| | | නාරම්මල | 89 |
| | | පොල්ගහවෙල | 90 |
| | | කුරුණෑගල | 91 |
| | | ඉබ්බාගමුව | 92 |
| | | දොඩම්ගස්ලන්ද | 93 |
| | | මොරතිහ | 94 |
| | | නිකවැරටිය | 95 |
| | | මහව | 96 |
| 19 | පුත්තලම | වෙන්නප්පුව | 83 |
| | | මාදම්පෙ | 84 |
| | | හලාවත | 85 |
| | | පුත්තලම | 86 |
| 20 | අනුරාධපුරය | මැදවච්චිය | 97 |
| | | කැකිරාව | 98 |
| | | අනුරාධපුරය | 99 |
| | | ගලෙන්බිඳුණුවැව | 100 |
| | | කහටගස්දිගිලිය | 101 |
| 21 | පොළොන්නරුව | පොළොන්නරුව | 102 |
| | | හිඟුරක්ගොඩ | 103 |
| 22 | බදුල්ල | බණ්ඩාරවෙල | 104 |
| | | වැලිමඩ | 105 |
| | | බදුල්ල | 106 |
| | | පස්සර | 107 |
| | | මහියංගනය | 108 |
| | | ගිරාඳුරුකෝට්ටේ | 109 |
| | | හසලක | 110 |
| 23 | මොනරාගල | බිබිල | 111 |
| | | මොනරාගල | 112 |
| | | වැල්ලවාය | 113 |

| | *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| 24 | රත්නපුර | ඇහැලියගොඩ | 118 |
| | | රත්නපුර | 119 |
| | | පැල්මඩුල්ල | 120 |
| | | බලංගොඩ | 121 |
| | | කලවාන | 122 |
| | | ඇඹිලිපිටිය | 123 |
| 25 | කෑගල්ල | කෑගල්ල | 114 |
| | | රඹුක්කන | 115 |
| | | මාවනැල්ල | 116 |
| | | රුවන්වැල්ල | 117 |

08 - 308

---

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

## කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026

1.0 කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.doenets.lk** වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026 සැප්තැම්බර් මස 25** දින වේ. මෙම විභාගය **දෙසැම්බර්** මස පැවැත්වේ.

නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳදරා ගත යුතු ය.

***සටහන.-*** **මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2026 අගෝස්තු මස 31 වැනි දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2026 සැප්තැම්බර් මස 25 වැනි දින ප.ව. 9.00ට අවසන් වේ.**

2.0 මෙම තරග විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන්නේ රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරන එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN 1-2025 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සඳහා පමණි. මෙම විභාගය පැවැත්වීමට අපේක්ෂිත නගර සහ නගරවලට අදාළ නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අපේක්ෂකයන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයන්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

| *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| කොළඹ | 01 | කිලිනොච්චිය | 14 |
| ගම්පහ | 02 | මඩකලපුව | 15 |
| කළුතර | 03 | අම්පාර | 16 |
| මහනුවර | 04 | ත්‍රිකුණාමලය | 17 |
| මාතලේ | 05 | කුරුණෑගල | 18 |
| නුවරඑළිය | 06 | පුත්තලම | 19 |
| ගාල්ල | 07 | අනුරාධපුරය | 20 |
| මාතර | 08 | පොළොන්නරුව | 21 |
| හම්බන්තොට | 09 | බදුල්ල | 22 |
| යාපනය | 10 | මොනරාගල | 23 |
| මන්නාරම | 11 | රත්නපුර | 24 |
| වවුනියාව | 12 | කෑගල්ල | 25 |
| මුලතිව් | 13 | | |

3.0 (i) මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති

උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

4.0 වැටුප:-

අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය රු.48,470 - 10x540 - 11x630 - 10x1,010 - 10x1,190 – 82,800/- (MN 2-2025) වේ. පත්වීමක් සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවකුට එම වැටුප හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමිවේ.

*සටහන.-* පත්වීම ලබන අවධියේ ක්‍රියාවේ යොදන වැටුප් වැඩිවීමේ නීති රීතිවලට යටත්ව, වැටුප් වැඩිවීම් වාසි ලබාදෙනු ලැබේ.

5.0 **සේවා කොන්දේසි:-**

(i) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත් කිරීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත් කිරීම් බලධරයාට බලය ඇත.

***සටහන.-*** මෙම බඳවා ගැනීම මගින් අධික පුරප්පාඩු ප්‍රතිශතයක් පවතින අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/කොමිෂන් සභාවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රමුඛතාව ලබා දෙන අතර මෙම තරග විභාගය සමත්ව පත්වීමක් සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් අනුයුක්ත කරනු ලබන සේවා ස්ථානයට රාජකාරි සඳහා වාර්තා කිරීමට බැඳී සිටී. පත්වීම් ලබා දීමෙන් අනතුරුව අනුයුක්ත කළ සේවා ස්ථානය සංශෝධනය සඳහා සිදු කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ii) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1840/34 සහ 2013.12.11 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

(iii) මෙම විභාගයෙන් සාමර්ථ්‍ය ලබන අයදුම්කරුවන්ට පත්වීමේ දින සිට එක් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත්වීම් දෙනු ලැබේ. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iv) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත් කරන ලද අයදුම්කරුවන් ස්ථාන මාරු කිරීමටත්, ශ්‍රී ලංකාවේ ඕනෑම තැනකට පත් කිරීමටත් යටත් වේ.

(v) පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු ස්ථාන මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම් පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(vi) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

**6.0** **යෝග්‍යතාව :-**

රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරන එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN 1-2025 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන්ට පමණක් මෙම තරග විභාගයට අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

*සටහන* **:- පළාත් රාජ්‍ය සේවාවල නිලධාරින්ට මෙම විභාගයට පෙනී සිටීම සඳහා අවසර නොමැත.**

මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබීම පිණිස සෑම අපේක්ෂක අපේක්ෂිකාවක්ම උක්ත සඳහන් සුදුසුකමට අමතරව,

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය. ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය.

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් **දෙවරකට නොවැඩි වාර ගණනකදී** භාෂාව/සාහිත්‍ය හා අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හය(06)කට නොඅඩුව සම්මාන සාමර්ථ දෙකක් (02) සහිතව සමත් වී තිබිය යුතු ය.

(iii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(iv) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

**(v) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2026 සැප්තැම්බර් 25 දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.**

*සටහන :-*

1. යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තාවූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තාවූ හෝ පුහුණු වීමේ කාල පරිච්ඡේදයක් ඉහත 6.0(i) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත 6.0(i) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

2. පත්වීම සඳහා අයදුම්කරු/අයදුම්කාරිය තෝරා ගනු ලැබී නම් ඔහු/ඇය මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟ විය යුතු ය.

3. අර්ධ කාර්මික කාර්යයන්හි නියුක්තව සිටින්නා වූ හෝ යම් කාර්යයක් සඳහා පුහුණු කර ඇත්තාවූ හෝ රජය විසින් විශේෂ පුහුණුවක් ලබා දී ඇත්තාවූ කවර හෝ ශ්‍රේණියක සේවකයන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් නොවනු ඇත. නිදසුන් වශයෙන් ඉංජිනේරු හා කර්මාන්තශාලා ශ්‍රේණිවල සේවකයන් හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය සේවිකාවන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු නොවනු ඇත. යම් සේවකයකු සුදුසු ද නුසුදුසු ද යන කරුණු පිළිබඳව යම් සැකයක් පහළ වූ විට දී ඒ සම්බන්ධයෙන් අයදුම්කරු/අයදුම්කාරිය, දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඒ සම්බන්ධව විමසිය යුතුය.

   එසේම මෙම කරුණට අදාළව යම් සේවකයකුගේ යෝග්‍යතාව සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකරන විමසීමකදී වැටුප් පරිමාණය සහිතව සේවකයාගේ කාර්යයන් පිළිබඳව සම්පූර්ණ විස්තරයක් අදාළ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම කාර්යය ඇරීම සඳහා අවශ්‍යතා සපුරා ගැනීමට පුහුණුවක් අයදුම්කරුට/අයදුම්කාරියට ලබාදී ඇත් ද යන වග හා එවැනි පුහුණුවක් වෙතොත් එම පුහුණුවේ ස්වභාවය හා කාල සීමාව ද සඳහන් කළ යුතු ය.

4. **රාජ්‍ය සේවයේ තාවකාලික හා අනියම් සේවකයන්, මණ්ඩල, සංස්ථා හා එවැනි අංශවල සේවකයන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් නොවනු ඇත.**

5. **තැපැල් දෙපාර්තමේන්තුවට අයත් ඒකාබද්ධ සේවයේ සේවකයන්ට හැර එම දෙපාර්තමේන්තුවේ ඉහත 3 හි සඳහන් අයුරින් පුහුණුවක් ලබා දී ඇති**

**කිසිදු සේවකයකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නැත.**

6. **මෙහි නියමිත සුදුසුකම් තමන් විසින් සපුරා ඇති බවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සෑහීමට පත්විය යුතුය. මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් නොමැතිව විභාගයට ඉදිරිපත්වන අයදුම්කරුවන්/අයදුම්කාරියන් විභාගයේ දී ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුව ද පත්වීම ලැබීමට නුසුදුස්සෝ වෙති.**

**7.0 විභාග කොන්දේසි:-**

(i) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතු ය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතු ය.

(ii) මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) විභාග ගාස්තුව රු. 600කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card)
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/Flex යෙදවුම මගින් (Bank of Ceylon Online Banking Method/Flex App)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

*සටහන:* ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(iv) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(v) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

(vi) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතු ය.

*සටහන:* ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය පැවැත්වෙන දින විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(vii) මෙම විභාගය සඳහා **විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන්** ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ **විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල** යන ලිපිනයට ඉදිරිපත් කළ යුතු ය.

(viii) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත්

භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. එම විස්තර සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

8.0 පත්කිරීම් බලධරයා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු/මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් යැවීමට හෝ **www.results.exams.gov.lk** වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ලැබේ.

9.0 අයදුම්කරුවන්ගේ අනන්‍යතාව.- විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

10.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

**11.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :-** ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

**12.0 විභාග පරිපාටිය සහ පත්වීම සඳහා තෝරාගනු ලබන ආකාරය :-**

විභාග විෂයය හා ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ :

| *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|
| භාෂා හැකියාව හා කළමනාකරණ සේවා නිලධාරි සේවා යෝග්‍යතා පරීක්ෂණය | 100 | 40 | *පැය 02 1/2* |
| අභියෝග්‍යතාවය | 100 | 40 | *පැය 01* |

සෑම ලිඛිත පිළිතුරු පතක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැක. පත්වීමක් සඳහා තෝරා ගැනීමට අයදුම්කරුවකු විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%ක්) ලබාගත යුතු වේ.

මෙම තරග විභාගයට අදාළව පුරප්පාඩු ගණනය කරන දිනට සේවයේ පුරප්පාඩු සංඛ්‍යාවෙන් සේවා ව්‍යවස්ථානුකූලව

30%ක පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් ලිඛිත විභාගයෙන් අත්කරගනු ලබන ලකුණු පදනම් කරගත් කුසලතා අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. උක්ත ඡේදයේ සඳහන් සීමිත තරග විභාගයේ ***අවම සමත් ලකුණු ප්‍රමාණය අත්කරගත් පමණින් කිසිදු අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට හෝ පත්වීමක් ලැබීම සඳහා සුදුසුකම් නොලබන බව අවධාරණය කරනු ලැබේ.***

**13.0 විෂයය නිර්දේශය : -**

**භාෂා හැකියාව හා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ යෝග්‍යතා පරීක්ෂණය: (කාලය පැය $2^{1/2}$ යි)**

අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද තොරතුරු අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යකින් ලිවීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් ද,

කාර්යාලයක ලියවිලි සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය පිළිබඳ මූලික නීති රීති සහ කළමනාකරණ සේවා නිලධරයකු විසින් කටයුතු කළයුතු කරුණු අඩංගු ලිපියක් පිළිබඳ ක්‍රියා කරන ආකාරය ආදී කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරින්ගේ රාජකාරි පිළිබඳව අපේක්ෂක/අපේක්ෂිකාවන් සතු දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නවලින් ද,

කාර්යාලයක ප්‍රයෝජනයට ගන්නා ඇමතුම් දින පොත, වවුචර්, චලන පත්‍රිකා, පැමිණීමේ ලේඛනය, දින මුද්‍රාව, මුද්‍රාව හා නාම මුද්‍රාව, තැපැල් මල්ල ආදී උපකරණ ගැනත් ඒවායින් ඇති ප්‍රයෝජන ගැනත් අපේක්ෂක/ අපේක්ෂිකාවන්ගේ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් ද මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

I වන කොටස - භාෂා හැකියාව මැනෙන ආකාරයේ අවබෝධය හා සම්බන්ධ ව්‍යුහගත ප්‍රශ්න, සාරාංශ කොට ලිවීම සහ රචනය (පැය 1 විනාඩි 15යි ලකුණු 50)

II වන කොටස - කළමනාකරණ සේවා නිලධාරි සේවයට යෝග්‍යතාව මැනෙන සිද්ධියක්, ප්‍රකාශයක් හෝ ඡේදයක් ඇසුරෙන් ගොඩනැගෙන කෙටි ප්‍රශ්න, ව්‍යුහගත ප්‍රශ්න සහ රචනා වර්ගයේ ප්‍රශ්න (පැය 1 විනාඩි 15යි ලකුණු 50)

**අභියෝග්‍යතාව (කාලය පැය 01)**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ සංඛ්‍යානමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

බහුවරණ ප්‍රශ්න සහ කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 50යි (කාලය පැය 01) ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

14.0 මෙම විභාග නිවේදනයට අනුව විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

15.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතු ය.

**එන්.යූ. නිශාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2026 අගෝස්තු මස 19 වන දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

08 - 309

---

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු සහයක III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

ශ්‍රී ලංකා දුම්රිය දෙපර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු සහායක තනතුරේ පුරප්පාඩු 80 ක් පිරවීම සඳහා 2026.09.28 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35ට නොවැඩි ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.09.28 වේ. මෙම විභාගය පැවැත්වීම සඳහා විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට අපේක්ෂිත නගර හා නගර අංක 1 වැනි උපලේඛනයේ දක්වා ඇත. ඉල්ලුම් පත්‍රයේ ඉහළ ශීර්ෂයේ මෙම නගර අංක ලේඛනයට අනුව සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එහෙත් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති නගරවල අයදුම්කරුවන් ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. කෙසේ වුව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කොට නොමැති නම් විභාගය කොළඹ දී

පමණක් පැවැත්වීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

**I වැනි උපලේඛනය**

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වව්නියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

**01. අයදුම්පත් කැඳවනු ලබන තනතුර :**

දුම්රිය එන්ජින් රියදුරු සහායක III ශ්‍රේණිය

**02. තනතුරේ රාජකාරි ස්වභාවය :**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු/ දුම්රිය එන්ජින් රියදුරු (ෂන්ටින්) ගේ කාර්යයන්ට උපස්ථම්භක වන සේ දුම්රිය ධාවනය යන කාර්යය සඳහා දුම්රිය එන්ජින් රියදුරු සහායක තනතුර වෙත පවරා ඇති රාජකාරි ලැයිස්තුවට අනුව රාජකාරි කටයුතු ඉටු කරනු ලබයි.

**03. වැටුප් පරිමාණය :** MT 1-2025

රු. 50,090 - 10×540 - 11×630 - 10×1010 - 10×190 - රු. 84,420/-
(රා.ප. ච. 10/2025 අනුව වැටුප් පරිවර්තනය කරනු ලැබේ.)

**04. (අ) අධ්‍යාපන සුදුසුකම් :**

(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

**(ආ) වෘත්තීය සුදුසුකම් :**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වසර 2½ක කාර්මික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

**(ඇ) කායික සුදුසුකම් :**

i. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
ii. උස අවම වශයෙන් අඩි 05 යි අඟල් 04 ක් විය යුතු ය.
iii. 6’6’, 6’6’ දෘෂ්ටි පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

**(ඈ) වෙනත් සුදුසුකම් :**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. අයදුම්කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ පිරිමි අයදුම්කරුවන් පමණි
iv. වයස අවු. 18ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතු ය.
(1991.09.28 දින හෝ ඊට පසුව උපන් දිනය යෙදී ඇති අයට හා 2008.09.28 දින හෝ ඊට පෙර උපන් දිනය යෙදී ඇති අයට ඉල්ලුම් කළ හැකි ය.)

*සටහන* - අයදුම්පත කැඳවනු ලබන අවසාන දිනය වන 2026.09.28 දිනට ඉහත සඳහන් සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**05. බඳවා ගැනීමේ ක්‍රමය :**

ඉහත (04) හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා විවෘත ලිඛිත තරග විභාගයක් පවත්වා එම ලිඛිත

පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන්ගෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ලබන අතර, එහිදී බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේද යන්න හා කායික යෝග්‍යතාවය තිබේද යන්න පරීක්ෂා කර අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගැනීම සිදුකරනු ලැබේ. මෙහිදී පොරොන්තු ලේඛණවල තබා බඳවා ගැනීමක් සිදු කරනු නොලැබේ.

06. බඳවා ගැනීමේ පරීක්ෂණයේ විභාග පටිපාටිය :

(i) විභාග ක්‍රමය :

(අ) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ.

(ආ) සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ ඉහත (04) යටතේ ඉල්ලා ඇති සුදුසුකම් සපුරා ඇති මාධ්‍යයෙනි. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) විභාගයේ විෂයයන් :

කාර්මික දැනුම - කාලය පැය 02 යි. ලකුණු 100 යි. සමත් ලකුණු සංඛ්‍යාව - ලකුණු 50 යි.

(iii) විෂය නිර්දේශය :

දුම්රිය රියදුරු සහායක තනතුරෙහි කාර්යභාරයට සමාන්තර වන සේ යන්ත්‍රෝපකරණ හා ඒවායේ භාවිතයන් පිළිබඳව සරල දැනුම පරීක්ෂා කෙරේ.

(iv) තේරීම් පටිපාටිය :

මෙම විභාගයෙන් ඉහළම ලකුණු ලබා සමත්වන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමක් සිදු නොවන අතර අයදුම්පත් කැඳවීම් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලැබේ. අදාළ සුදුසුකම් සපුරන්නේ නම් ලිඛිත පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙල අනුව අයදුම්පත් කැඳවන අවස්ථාවේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවාගනු ලැබේ.

(v) විභාග ප්‍රතිඵල :

*ගැසට්* නිවේදනයේ 06 (iv) ඡේදය අනුව ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ද ප්‍රතිඵල දන්වා යවනු ඇත.

07. **විභාග ගාස්තු :**

විභාග ගාස්තුව රු. 1,200.00 කි. එය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට දුම්රිය සාමාන්‍යාධිකාරීගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-100129027-313 ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත් අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබාගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

08. **අයදුම්පත් යොමු කිරීම පිළිබඳ උපදෙස් :**

අයදුම්පත් මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය භාවිත කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළවන පිටුවට ද, 07 සිට 11 තෙක් එහි දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන පරිද්දෙන් තම අයදුම්පත සකස්කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස්කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලවද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කෙර තිබේද? යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට ලදුපත අලවා ඇද්ද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට ලදුපත අලවා ඇද්ද යන්න පිළිබඳව නැවත විමසිලිමත් විය යුතුය. තවද මේ පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

(අ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(ආ) විභාගය සඳහා වන නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් 2026.09.28 දින හෝ ඊට පෙර හෝ ලැබෙනු පිණිස එවිය යුතු ය. අයදුම්පත් බහා ඇති

ලිපි කවරයේ, වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු සහායක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026" යනුවෙන් ලිවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරී,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
පත්වීම් ශාඛාව,
තැ.පෙ. 355,
ඕල්කට් මාවත,
කොළඹ 10.

(ඇ) අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රාවේශපත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඈ) අඩුපාඩු සහිත අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඉ) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන වෙත ලිඛිත විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත් පත් වල හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිළ වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රාවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම් කළ විභාගයේ නම් අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහා ජතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් ලිපියක් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මගින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වනු ඇත.

තව ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත් තැපැල් කිරීමේ දී ලියාපදංචි කරන ලද කුවිතාන්සිය ද සූදානම්ව තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**09. විභාගයට පෙනී සිටීම**

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගය පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිපල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවනු ඇත.

*සටහන* - අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

**10.** විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(a) ජාතික හැඳුනුම්පත,
(b) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(c) වලංගු ශ්‍රී ලාංකිය රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකක් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**11. සේවා කොන්දෙසි :**

දුම්රිය එන්ජින් රියදුරු සහායක III ශ්‍රේණියට බඳවාගනු ලබන මෙම නිලධාරීන් බඳවාගනු ලබන දින සිට මාස තුනක (03) පුහුණු කාලයකට යටත්කර දුම්රිය එන්ජින් රියදුරු සහායක තනතුරෙහි රාජකාරිවලට අදාළව ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුවක් ලබා දෙනු ලැබේ.

**12. සේවයේ නියුත්ත කිරීමේ කොන්දේසි :**

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තවදුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

ii. පත්වීම සඳහා සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යය අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කළ යුතු වේ.

iii. තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධානවලටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත්කර ඇති ආයතන කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ විධිවිධානවලටත් යටත්ව කටයුතු කළ යුතු ය. එමෙන්ම, විටින්විට රජය විසින් නිකුත් කරන නියෝගයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටියි.

13. i. මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් දුම්රිය එන්ජින් රියදුරු සහායක අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සියලුම විධිවිධාන අදාළවන බව දැනුම් දෙමි.

ii. විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම මෙම තනතුර සඳහා සුදුසුකමක් වන්නේ සැයි නොසැළකිය යුතු ය.

iii. මෙම නිවේදනයේ ආවරණය නොවන කිසියම් කරුණක් පිළිබඳව අවසාන තීරණය ගැනීමේ බලය දුම්රිය සාමාන්‍යාධිකාරි සතු වේ.

iv. මෙම නිවේදනයේ සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය නිවේදන අතර කිසියම් අනුකූලතාවක් ඇත්තේ නම් එවැනි විටකදී සිංහල භාෂාවෙන් වන නිවේදනය නිවැරදි බව සලකා කටයුතු කළ යුතු ය.

රවීන්ද්‍ර පත්මප්‍රිය,
දුම්රිය සාමාන්‍යාධිකාරි.

(මේ අනුව A-4 කඩදාසිවල දෙපසම භාවිත කරමින් පිළියෙල කරගත් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීමේ නිවේදනය කියවා හොඳින් වටහා ගත යුතු ය.)

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු සහායක III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026***

**Open Competitive Examination For Recruitment for The post of Railway Engine Driver Assistant Grade - III, of Sri Lanka Railway Department - 2026**

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා*

විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍ය
සිංහල -1
දෙමළ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| *විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| 1 වැනි කැමැත්ත | | |
| 2 වැනි කැමැත්ත | | |
| විභාග නිවේදනයේ ආරම්භක ඡේදය බලන්න. ඉල්ලුම් කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. | | |

01. සම්පූර්ණ නම :
(i) සිංහලෙන්/දෙමළෙන් : ..............................................................................
(ii) ඉංග්‍රීසියෙන්: ..........................................................................................

02. මුලකුරු සමග නම :
(i) සිංහලෙන්/දෙමළෙන් : ..............................................................................
(iii) ඉංග්‍රීසියෙන්: ..........................................................................................

03. ස්ථිර ලිපිනය :
(i) සිංහලෙන්/දෙමළෙන් : .............................................................................................................................
.............................................................................................................................
(ii) ඉංග්‍රීසියෙන් : .............................................................................................................................
.............................................................................................................................

04. ස්ත්‍රී/ පුරුෂ භාවය:

ස්ත්‍රී 1
පුරුෂ 0 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

06. පදිංචිය :
(i) ග්‍රාම නිලධාරි කොට්ඨාසය : ................................... එහි අංකය : ☐
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ...............................
(iii) දිස්ත්‍රික්කය : .............................................................

07. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

08. දුරකථන අංකය : 1.☐☐☐☐☐☐☐☐☐☐

2. Whatsapp ☐☐☐☐☐☐☐☐☐☐

09. 28.09.2026 දිනට වයස : අවුරුදු : ☐☐☐☐ මාස : ☐☐ දින : ☐☐

10. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ.පො.ස. (සා.පෙළ.) :

විභාග අංකය : .................................. වර්ෂය : ............................

| *අනු. අංකය* | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |
| (iv) | | |
| (v) | | |
| (vi) | | |
| (vii) | | |
| (viii) | | |
| (ix) | | |
| (x) | | |

(ii) වෘත්තීය සුදුසුකම් :
..........................................................................................................................................................
..........................................................................................................................................................

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද? :

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුව තුළ "X" ලකුණ යොදන්න.)

12. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සහ/හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවා ද මම පුද්ගලිකව දරා ගනිමි.

(ඇ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

(ඉ) සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

(ඊ) 2026 .........................දින ............................................. බැංකුවේ ......................................... ශාඛාවට රු. 1,200.00 ක් ගෙවා ලබාගත් මුදල් බැරපතෙහි පිටපතක් මේ සමග අමුණා එවමි.

දිනය : .................................................... ..........................................................
අයදුම්කරුගේ අත්සන

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන, ජාතික හැඳුනුම්පත් ......................................... දරන අංක................................ ............................................. මහතා මා පෞද්ගලිකව දන්නා බවත් ඔහු අද දින මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

.......................................................,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම : ..........................................................
තනතුර : ..........................................................
ලිපිනය : ..........................................................
දිනය : ..........................................................

**14.** දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත ඉදිරිපත්කර ඇති ...................................... මහතා, ........................... දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................... දින සිට ...................... දක්වා ................................................... වශයෙන් සේවයකර ඇත. ඔහුට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී ඇත/ නැත. ඔහුගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායකය/ අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු සහායක සේවයේ III ශ්‍රේණිය සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ ආයතනයෙන් මුදා හැරීමට හැකි/ නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

...........................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : .................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ..............................................
තනතුර : .....................................................
ලිපිනය : ...................................................

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
## අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 02 සේවා ගණයේ III ශ්‍රේණියේ නිවාස පාලක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ නිවාස පාලක තනතුරෙහි 2024.12.31 දිනට පැවති පුරප්පාඩුව පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය. ඒ අනුව, වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුවන්ගේ උපන්දිනය 2008.09.28 දින හෝ ඊට පෙර හා 1996.09.28 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.

03. 2025.03.25 දිනැති අංක 10/2025 දරන රා.ප.ච. MN-1 2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය, රු. 45,230-10X540-11X630-10X890-10X1,190 රු.78,360ක් වන අතර, එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිටය. පත්වීම ක්‍රියාත්මක දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන 111 හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත්විය යුතුවේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයකට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අයදුම්කරුවන් පහත සඳහන් සියලුම මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ.

*මූලික අධ්‍යාපන සුදුසුකම් :-*

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තව විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම

*වෘත්තීය සුදුසුකම්* - අදාළ නොවේ.

**පළපුරුද්ද**

නේවාසිකාගාර පාලනය හා පවත්වාගෙන යාම, ආහාර සැපයීම, ඊට අදාළ ගිණුම් තැබීම පිළිබඳ රජයේ / සංස්ථාවක හෝ රජයේ පිළිගත් හෝටලයක/ පාසල් නේවාසිකාගාරයක/ තානායමක වර්ෂ 01 ක පළපුරුද්ද පිළිබඳ සහතිකය.

*වෙනත්,*

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද ඇතුළු සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**06. අයදුම් කළ යුතු ක්‍රමය :-**

(*අ*) මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇති ආදර්ශ ආකෘතිය අනුව, A4 (21cm x 29 cm) ප්‍රමාණයේ කඩදාසියක දෙපසම භාවිත කරමින් අංක 1 සිට 7 දක්වා ඡේද මුල් පිටුවට ද අංක 8 දෙවන පිටුවටද, අංක 09 සිට 11 දක්වා තෙවන පිටුවට ද අනෙකුත් ඡේද පිළිවෙලින් අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි අයදුම්පත් පිළියෙල කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

(*ආ*) අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

(*ඇ*) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.09.28 දින හෝ ඊට ප්‍රථම "අධ්‍යක්ෂ ජනරාල්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, ගැටඹේ, පේරාදෙණිය." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(*ඈ*) විභාග ගාස්තුවට අදාළ මුදල වන රු. 1,000.00 මුදල, මුදල් ඇණවුමක් මගින් අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් නමින් පේරාදෙණිය තැපැල් කාර්යාලයෙන් මාරු කර ගත හැකි වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකින් ලබාගෙන එම මුදල් ඇණවුම අයදුම්පතෙහි අදාළ ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බවද කාරුණිකව දන්වමි. විභාගය සඳහා ගෙවන

ලද ගාස්තුව මොනම හේතුවක් මත ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

(ඉ) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර, සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, තැපෑලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් පිළිබඳව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ. එබැවින්, අයදුම්පත්‍ර යොමු කිරීමට ප්‍රථම විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර ඇතිද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත්කොට මුදල් ඇණවුම අලවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වන ලෙස දන්වමි. තවද, සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ මුදල් ඇණවුමෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඊ) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. දැනටමත් රජයේ සේවයේ නියුතුවූවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එම අයදුම්කරුවන් තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතු ය.

**ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්** - අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු පමණක් සැපයිය යුතු ය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බවට අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළි වුවහොත් හෝ ඔහුට/ ඇයට තවදුරටත් පත්වීමක් ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතු කොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුවද යටත් වේ.

07. විභාග පරිපාටිය :-

(අ) විභාග නිවේදනය සඳහා සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අපේක්ෂකයකු විභාගය සඳහා පෙනී සිටීමේදී තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාගය මහනුවරදී පමණක් පැවැත්වේ. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.dea.gov.lk මගින් පළකරනු ඇත.

(ඇ) නිවේදනය පළවී දින 04 ක් 05 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. (දුරකථන අංකය 0812068381)

(ඈ) පහත සඳහන් තොරතුරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(i) විභාගයේ නම
(ii) අපේක්ෂක/අපේක්ෂිකාවගේ සම්පූර්ණ නම
(iii) ලිපිනය
(iv) ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කළ දිනය, ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය හා අංකය
(v) විභාග ගාස්තු ගෙවූ මුදල් ඇණවුමේ අංකය, දිනය හා තැපැල් කාර්යාලය

(ඉ). විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/ අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(ඊ). *අනන්‍යතාවය* :- තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය සනාථ කළ යුතු ය. මේ සඳහා,

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත; හෝ
(ii). වලංගු විදේශ ගමන් බලපත්‍රය; හෝ
(iii). වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය පිළිගැනේ.

විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්හට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(උ). **විෂයය නිර්දේශය :-**

| *විෂයය අංකය* | *විෂයයන්* | *කාලය පැය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 1 1/2 | 100 | 40% |
| 02 | විෂය දැනුම මැනීමේ අභියෝග්‍යතා පරීක්ෂණය | 1 1/2 | 100 | 40% |

(i). **බුද්ධි පරීක්ෂණය :-**
භාෂාමය, ගණිතමය හා තර්කන හැකියාව මැන බැලීම සඳහා බහුවරණ ප්‍රශ්න ඇතුළත් වේ.

(ii). **විෂය දැනුම මැනීමේ අභියෝග්‍යතා පරීක්ෂණය**
තනතුරට අදාළ විෂයයන් ආවරණය වනසේ සකසන ලද කෙටි ප්‍රශ්න වලින් යුක්තය.

(ඌ). මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

08. පුපප්පාඩු සංඛ්‍යාව හා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :-

(i) පුරප්පාඩු සංඛ්‍යාව 01 කි. **මෙම පුරප්පාඩුව පවතිනුයේ මෙම දෙපාර්තමේන්තුවේ මාතලේ, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානය යන ලිපිනයේ පමණි.**

(ii) මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස සේවා කාලයකට යටත් වනු ඇත.

09. බඳවා ගැනීමේ ක්‍රමය :-

ලිඛිත තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40%ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයන්ගේ මුලු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට පස් ගුණයකට සමාන සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ඉන් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරු පුරප්පාඩු තනතුර සඳහා තෝරාගනු ලැබේ. (ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර පහත වගුවේ දැක්වේ.)

| *ලකුණු ලබාදෙනු ලබන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 25 | |
| 3. අතිරේක පළපුරුද්ද | 30 | |
| 4. භාෂා ප්‍රවීණතාවය | 10 | අදාළ නොවේ. |
| 5. පරිගණක හැකියාව | 10 | |
| 6. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 | |
| මුළු ලකුණු | 100 | |

10. තරග විභාගයට පෙනී සිටීම සඳහා විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම අයදුම්කරු විභාගයට ඉදිරිපත් වීම සඳහා වන මෙම නිවේදනයේ සඳහන් තනතුරට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් පත්වීම් ලැබීමට නුසුදුස්සකු සේ සලකා ක්‍රියා කරනු ලැබේ.

11. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධ පත්වීම් බලධාරියා වන අපනයන කෘෂිකර්ම

අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

12. විභාගය පැවැත්වීමේදී හා ප්‍රතිඵල නිකුත් කිරීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු) විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඇයට හෝ ඔහුට සිදුවනු ඇත.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**එම්. කේ. එස්. ආර්. ඩී. සමරසිංහ,**
අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 02 සේවා ගණයේ III ශ්‍රේණියේ නිවාස පාලක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

**Open Competitive Examination for the Recruitment to the Post of Hostel Warden of class III of the Management Assistant Non Technical Service Category in the Department of Export Agriculture - 2026**

**විභාගය අංකය** [ ]
**(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)**

1.0 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- සිංහල 2
දෙමළ 3
ඉංග්‍රීසි 4

[ ]
(අදාළ කොටුව තුළ ලියන්න)

2.0 නම :-

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
: .......................................................................................................................
(උදා :- GUNAWARDHANA, H.M.S.K.)
.......................................................................................................................

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :-
.......................................................................................................................................................................

3.0 ස්ථිර ලිපිනය :-
.......................................................................................................................................................................
.......................................................................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

3.1 ස්ථිර පදිංචි ලිපිනය :..................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.2 දුරකථන අංකය (සක්‍රියව භාවිතාවන :- ජංගම
Whatsapp
සහිත ජංගම දුරකථන අංකය)
ස්ථාවර

3.3 විද්‍යුත් තැපැල් ලිපිනය (ඊ මේල්) :- ……………………………………………………….......................................

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :-

5.0 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී 1 පුරුෂ 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

6.0 විවාහක /අවිවාහක බව :
විවාහක - 2
අවිවාහක - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

7.0 7.1 උපන් දිනය :
වර්ෂය : මාසය : දිනය :

7.2 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :- (..........................................)

(උදා :- ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනය 2026.01.31 නම් අයදුම්කරු 1996.01.31 හා 2008.01.31 අතර උපන් අයෙකු විය යුතු වේ.)

අවුරුදු : මාස : දින :

8.0 අධ්‍යාපන සුදුසුකම් :-

(අ) අ.පො.ස. (සා/පෙළ) :-

වර්ෂය හා මාසය ........................................................................
විභාග අංකය ........................................................................
භාෂා මාධ්‍යය ........................................................................

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

(ආ) අ.පො.ස. (උ/පෙළ) :-

වර්ෂය හා මාසය ........................................................................
විභාග අංකය ........................................................................
භාෂා මාධ්‍යය ........................................................................

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

- නිවේදනයේ 6 ඊ ඡේදයෙහි සඳහන් නිලධාරියෙකු මගින් සහතික කරන ලද අධ්‍යාපන සහතික අයදුම්පත සමග අමුණා ඉදිරිපත් කරන්න.

(ආ) පළපුරුද්ද :-

| ආයතනයේ නම | සේවා කාලය (අවුරුදු) |
|---|---|
| | |
| | |

09. විභාග ගාස්තු :

| | |
|---|---|
| විභාග ගාස්තු ගෙවනු ලැබූ මුදල් ඇණවුමේ අංකය | |
| දිනය | |
| මුදල් ගෙවූ තැපැල් / උපතැපැල් කාර්යාලය | |
| ගෙවන ලද මුදල | |

මුදල් ඇණවුමේ මුල් පිටපත මෙහි අලවන්න.
(මුදල් ඇණවුමේ පිටපස ඉහළ කොටසෙහි පමණක් ගම් ගා අලවන්න)

10. අයදුම්කරුගේ සහතිකය:

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුසුදුස්සවීමට යටත්වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම දැන සිටිමි.

තව ද මෙම විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අධ්‍යක්ෂ විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

දිනය ........................ ....................................,
අයදුම්කරුගේ අත්සන.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................ යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ ඇය මා ඉදිරිපිට දී ..................... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත ඉදිරිපත්කර ඇති බව ද සහතික කරමි.

..............................,
අත්සන සහතික කරන්න නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

සහතික කරන්නාගේ :
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ..................................
තනතුර :..............................
ලිපිනය :..............................
දිනය :.................................
(නිල මුද්‍රාව සනාථ කරන්න)

12. අයදුම්කරු රජයේ සේවයේ නියුක්ත වූවෙක් නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය :- :

ඉහත තොරතුරු සඳහන් .................................................................................. මයා/ මිය/ මෙනවිය ................................................ ............................. මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ සේවය කරන බව ද, ඔහුගේ/ ඇයගේ සේවය සතුටුදායක බව ද නියමිත විහාග ගාස්තුව ගෙවා ඇති බව ද, මෙම විහාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/ නොහැකි බව ද, ඉහත සඳහන්කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

දිනය :- ................................................ .................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .................................
තනතුර :..............................
ලිපිනය :..............................
(නිල මුද්‍රාව)

08 - 312

---

**ආරක්ෂක අමාත්‍යාංශය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි ( III ශ්‍රේණිය/ පුහුණු ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2026**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි (III ශ්‍රේණිය/ පුහුණු ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන සීමිත තරඟ විභාගය සඳහා සුදුසුකම්ලත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීම සම්බන්ධයෙන් 2026.07.10 දිනැති අංක 2494 දරන *ගැසට් පත්‍රයේ* 07 - 196/2 පුරප්පාඩු දැන්වීම පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

01.

ii. **ලිඛිත විභාගය - මෙම විභාගය ප්‍රශ්න 02 කින් සමන්විත වේ.**

i. **ගණිතය පිළිබඳ මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය**
ii. **තනතුරට අදාළ මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය**

• 13

1. ලිඛිත විභාගය -
විෂයයන් :

02. තනතුරට අදාළ මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය

ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය

| *විෂයය අංකය* | *විෂයය* | *නියමිත කාලය* | *ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය (අවම)* |
|---|---|---|---|---|
| 01 | ගණිතය පිළිබඳ මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40 |
| 02 | තනතුරට අදාළ මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40 |

(*ආ*) තනතුරට අදාළ මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය
රචනාමය පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පත්‍රයකි. ලබාදෙනු ලබන ප්‍රශ්න 07 තුළින් ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතු වේ. (ලකුණු 20 X 5 =100)

**ඒ. එල්. කේ. විජේමාන්නගේ,**
අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

2026 අගෝස්තු මස 12 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

08 - 322

**රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 40ක් සීමිත පදනම මත සම්පූර්ණ කිරීමට පවත්වන සීමිත තරග විභාගය සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 අගෝස්තු මස 31 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 සැප්තැම්බර් මස 30 වැනි දින ප.ව. 09.00ට අවසන්වේ.**

නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

මෙම විභාගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව, විභාග කොමසාරිස් ජනරාල් විසින් දෙසැම්බර් මස කොළඹ දිස්ත්‍රික්කයේ දී පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට යටත්ව විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

01. මෙම නිවේදනයේ,

(අ) **"ලේකම්"** යන පදයෙන් අදහස් කරනුයේ **"රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්"** වේ.

(ආ) **"සේවය"** යන පදයෙන් අදහස් කරනුයේ වෙනත් ආකාරයකින් සුවිශේෂී කොට සඳහන් කර නොමැති අවස්ථාවන්හි දී **"ශ්‍රී ලංකා පරිපාලන සේවය"** වේ.

02. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණිය සඳහා වේ.

(අ) **ලිඛිත විභාගය -** මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර හතර (04) කින් සමන්විත වේ.

i. සාමාන්‍ය බුද්ධිය

ii. ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා

iii. රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය I (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව)

iv. රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව)

(ආ) **සම්මුඛ පරීක්ෂණය -** ලිඛිත විභාගයේ සියලුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බවට සනාථ වූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි.

මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ, සම්පූර්ණ කිරීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව සහ එම පුරප්පාඩු ප්‍රමාණයෙන් 25%ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ලේකම් විසින් තීරණය කරනු ඇත.

03. මෙම තනතුර සඳහා පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ.

04. **සේවා කොන්දේසි :-**

04.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1842/2 සහ 2013.12.23 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29

හා 2022.12.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

04.2 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

04.3 මෙම පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් ය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

04.4 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර තුනක් (03) ඉකුත් වීමට පෙර රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු වේ.

04.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා/ හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසිකරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

05. **මාසික වැටුප් පරිමාණය :-**

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 82,150-10x2,400-8x2,940-17x3,900 -195,970/- ( SL-1-2025) වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

06. **බඳවා ගැනීමේ සුදුසුකම් :-**

(*අ*) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

(*ආ*) අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

*හෝ*

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්

*හෝ*

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් උපාධියක්

*සහ*

රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක හෝ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි වැටුප් කේත අංක MN-2-2025 හෝ ඊට ඉහළ MN වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන හෝ SL-1-2025 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක/තනතුරක, අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම.

*හෝ*

(ii) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක හෝ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි වැටුප් කේත අංක MN-2-2025 හෝ ඊට ඉහළ MN වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන හෝ SL-1-2025 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක/තනතුරක, අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම.

*සටහන :*

1. උපාධිය බලපවත්නා දිනය, සුදුසුකම් සපුරන දිනට හෝ එදිනට පෙර දිනයක් විය යුතුය.

2. ඉහත සඳහන් කාලය ගණනය කිරීමේදී රාජ්‍ය සේවය සහ/හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි අදාළ අඛණ්ඩ සේවා කාලයන්හි එකතුව ගණන් ගනු ලැබේ.

3. 2013.12.23 දිනට වැටුප් කේත අංක MN-2-2006 හෝ ඊට ඉහළ MN වැටුප් කේත යටතේ වැටුප් ලබා පසුව එම වැටුප් කේත වෙනත් වැටුප් කේතයකට සංශෝධනය කරන ලද සේවාවක, ඉහත (ආ) (i) හෝ (ආ) (ii) යටතට ගැනෙන නිලධාරීන් මේ සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) වයස සහ සපුරා තිබිය යුතු වෙනත් සුදුසුකම් :

(i) සුදුසුකම් සපුරන දිනට වයස් සීමාව අවුරුදු පනස් තුන (53) ට නොවැඩි විය යුතුය. ඒ අනුව 1973.08.28 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

(ii) ඉහත 6 (ආ) හි සඳහන් සේවයක/තනතුරක ස්ථිර කර තිබීම.

***සටහන :*** මේ වන විට අදාළ පත්වීම් බලධරයා විසින් සේවය/ තනතුර ස්ථිර කිරීමට අදාළ ලිපිය නිකුත් කර නොමැති නමුත් විභාග නිවේදනයේ 06 ඡේදය අනුව විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති සහ අදාළ සේවා ව්‍යවස්ථාව / බඳවා ගැනීම් පටිපාටිය අනුව සේවයේ ස්ථිර කිරීමට අදාළ සියලු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට ද මෙම විභාගයට අයදුම්කළ හැකිය. එහෙත් එම නිලධාරින්,

1. සේවයේ ස්ථිර කිරීමට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට සමත්ව තිබිය යුතු ය.

2. එම නිලධාරීන් මෙම විභාගය සමත්ව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබයි නම් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වන අවස්ථාව වන විට සේවයේ ස්ථිර කිරීමේ ලිපිය අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු ය. (ස්ථිර කිරීමේ දිනය සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට හෝ ඊට පෙර වන පරිදි බලාත්මක විය යුතු ය.)

(iii) සුදුසුකම් සපුරන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

(ඈ) සුදුසුකම් පිළිබඳ සීමාවන්

(i) සීමිත තරග විභාගය සඳහා වාර තුන (03) කට වඩා පෙනී සිටීමට කිසිදු අයදුම්කරුවකුට අවසර නොමැත.
(පෙර සේවා ව්‍යවස්ථා යටතේ අයදුම්කරුවන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාග සඳහා පෙනී සිටි වාර ගණන අදාළ කර ගනු නොලැබේ.)

(ii) මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ගැසට් නිවේදනය පළ කරන දිනට හෝ එදිනට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(iii) කුමන හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

07. **විභාග ගාස්තු :-**

විභාග ගාස්තුව රු.1200/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පත් මගින් (Any Bank Credit Cards)
(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පත් මගින් (Any Bank Debit Card with Internet Payment facility)
(iii) ලංකා බැංකු මාර්ගගත බැන්කින් ක්‍රමය/ Flex යෙදවුම මගින් (Bank of Ceylon Online Banking Method)/ Flex App
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

***සටහන:*** ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(v) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

08. **ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-**

(i) මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක්

ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ හා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

(iii) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

09. **විභාගයට ඇතුළුවීම :-**

(i) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රය ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත. **විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.**

*සටහන :* අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :-**

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන කිසිවකු විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11. **සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :-**

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

13. **විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :-**

(i). විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.
(ii). විභාගයට පෙනී සිටින ලද මාධ්‍යය පත්වීම් මාධ්‍යය ලෙස සලකනු ලැබේ.

සටහන : (1) අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුර සැපයිය යුතු ය.
(2) අයදුම්පතෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර දෙනු නොලැබේ.

14. **බඳවා ගැනීමේ ක්‍රමය :-**

14.1 ලිඛිත විභාගය:

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර හතර (04) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂය සමත් වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| | ***විෂයය*** | ***ලකුණු ප්‍රමාණය*** | ***සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය*** |
|---|---|---|---|
| 1 | සාමාන්‍ය බුද්ධිය | 100 | 50 |
| 2 | ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා | 100 | 50 |
| 3 | රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය I (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව) | 100 | 50 |
| 4 | රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව) | 100 | 50 |

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු ය.

14.2. සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ

(i) සම්මුඛ පරීක්ෂණය, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් දෙක (02) කින් යුක්ත වේ.

(අ). සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

(i). ඉහත අංක 06හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූලද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii). සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

(ආ). ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

(i). රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ කළමනාකරණ කුසලතා, නායකත්ව ගුණාංග, සන්නිවේදන කුසලතා සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු විසිපහ (25) කි.

| | විෂය ක්ෂේත්‍රය | උපරිම ලකුණු |
|---|---|---|
| 01 | කළමනාකරණ කුසලතා | 10 |
| 02 | නායකත්ව ගුණාංග | 05 |
| 03 | සන්නිවේදන කුසලතා | 05 |
| 04 | පෞරුෂත්වය | 05 |
| එකතුව | | 25 |

(ii) එක් එක් විෂයය සඳහා අවම වශයෙන් සියයට පනහ (50%) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතරින් සියලුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ, සම්පූර්ණ කිරීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව සහ එම පුරප්පාඩු ප්‍රමාණයෙන් 25%ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත දැක්වෙන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

(iii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර එහිදී ලකුණු ලබා දෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතරින් කිසියම් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුව ද එසේ සුදුසුකම් නොලැබුවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

(iv) බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේදී ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් සේවයේ තුන (III) ශ්‍රේණියට බඳවාගනු ලැබේ.

***සැලකිය යුතුයි :-*** සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14.3. පත්වීම් බලධරයා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් යැවීමට හෝ **www.results.exams.gov.lk** වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

15. **ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :-**

**(01) සාමාන්‍ය බුද්ධිය**

සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළැඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 1 ½ යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න වලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.)

**(02) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා**

ශ්‍රී ලංකාවේ හා ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ, ගෝලීය තත්ත්වයන් පිළිබඳ විෂය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්ත්වයන් හා අදාළව නිර්මාණාත්මකව විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3 යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ)

**(03) රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය I (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව)**

රාජ්‍ය සේවයේ විවිධ පරිසරයන්හි ඇතිවිය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් හෝ සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/ සිද්ධීන් අපේක්ෂකයාට යොමු කර අපේක්ෂකයා සතු නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට අදාළ රාජ්‍ය සේවයේ පරිචය ආශ්‍රයෙන් මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3 යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

**(04) රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව)**

දෙන ලද මාතෘකාවන්/තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකාවන්/ තේමාවන් ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3 යි - ලකුණු 100 යි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ආලෝකබණ්ඩාර,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2026 අගෝස්තු මස 21 වැනි දින.

08 - 382

---

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි/ කාන්තා) - III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත ලිඛිත තරග විභාගය - 2026

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි) තනතුරේ පුරප්පාඩු 239 ක් හා දුම්රිය ආරක්ෂක (කාන්තා) තනතුරේ පුරප්පාඩු 17 ක් සඳහා බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1) මෙමගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි/ කාන්තා) තනතුර සඳහා වේ.

2) අයදුම්පත් කැඳවන අවසාන දිනය - 2026.09.28

*සටහන -*

1. අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය දක්වා අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද

කිරීමෙන් සිදුවිය හැකි අගතිය පිළිබඳව ගැටලු අයදුම්කරුවන් විඳදරාගත යුතු ය.

2. ඉදිරිපත් වන සියලු අයදුම්කරුවන් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇතිය යන පූර්ව උපකල්පනය මත ඉදිරි පියවර සඳහා යොමු වන බැවින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට හෝ ලිඛිත පරීක්ෂණයට යොමු වීම අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීමක් ලෙස සලකා නොබලන බව අවධාරණයට යටත් කර ගත යුතු ය.

**1.1 යෝග්‍යතාවය ඇගයීමේ මූලික පරීක්ෂණය හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය-**

සියලු අයදුම්කරුවන් මෙම පරීක්ෂණය සඳහා යොමු කරවන අතර එයට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් 50% ක් හෝ ඊට ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා වූ අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයට යොමු කරනු ලැබේ.

| ***ක්‍රියාකාරකම*** | ***කාලය*** | ***ලකුණු*** |
|---|---|---|
| දුර දිවීමේ මීටර /Run meters 1000 | විනාඩි 03 ට අඩු නම් | 30 |
| | විනාඩි 03 ත් 04 ත් අතර | 20 |
| | විනාඩි 04 ත් 05 ත් අතර | 10 |
| | විනාඩි 05 ට වැඩි නම් | අසමත් |
| Chinup (වාර 05 ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Situp (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Squat Thrust (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Kim Gem (මතකය පරීක්ෂා කිරීම) | අයිතමයන් නිරීක්ෂණය කිරීම සඳහා තත්ත්පර 30 යි ධාරණය කර ගැනීමට තත්පර 30 යි ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 |

දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන මූලික පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. අයදුම්කරුවන් විසින් මූලික පරීක්ෂණයට මුහුණ දීමට නුසුදුසු නොවන බවට කැඳවීම් ලිපිය සමගඅමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

**1.2 ලිඛිත විභාගය -**

එම යෝග්‍යතාවය ඇගයීමේ මූලික පරීක්ෂණයෙන් පසු මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. තම අයදුම්පතේ භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අයදුම්කරුට ඉඩදෙනු නොලැබේ.

1) බුද්ධි පරීක්ෂණය
2) භාෂාව හැකියාව

**1.3 යෝග්‍යතාවය ඇගයීමේ මූලික පරීක්ෂණය හා ලිඛිත විභාගය පවත්වන දින -**

යෝග්‍යතාවය ඇගයීමේ මූලික පරීක්ෂණය හා මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමට දුම්රිය සාමාන්‍යාධිකාරීට බලය ඇත.

**02.** පුරප්පාඩු සංඛ්‍යාව 256 කි (දුම්රිය ආරක්ෂක - පිරිමි 239 ක් හා කාන්තා 17 ක් වශයෙන්). අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම

පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

**03. සේවා කොන්දේසි :-**

3.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද, දුම්රිය ආරක්ෂක සේවයේ බඳවා ගැනීම් පරිපාටියෙහි පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධන වලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධාන වලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන වලට ද, යටත්ව තෝරා ගනු ලබන අයදුම්කරුවකු ආරක්ෂක තනතුරට පත්කරනු ලැබේ.

3.2 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිය තීරණයකට යටත්විය යුතු ය.

3.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක තනතුරට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

3.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 18/ 2020 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

3.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හෝ පත්කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට දුම්රිය සාමාන්‍යාධිකාරීට බලය ඇත.

**04. මාසික වැටුප් පරිමාණය**

2025.03.25 දිනැති 10/2025 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය (RS 1-2025) රු. 49, 550 - 7 X 540 - 27 X 670 - 71,420 /- වේ. එනම් රු. 49, 550 /- ආරම්භක වැටුප් තලයෙහි පිහිටවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

**05. බඳවා ගැනීමේ සුදුසුකම් :**

(අ) **කායික සුදුසුකම් -**

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(ii) උස (පාවහන් නොමැතිව)
- පිරිමි අයදුම්කරුවන් සඳහා අඩි 05 යි අඟල් 06 ක් තිබිය යුතුය. (5’ 6”)
- කාන්තා අයදුම්කරුවන් සඳහා අඩි 05 යි අඟල් 02 ක් තිබිය යුතු ය. (5’ 2”)

(iii) ඇස් පෙනීම :- ඇස් කණ්ණාඩි නොමැතිව “ඒ “ 2 දෘෂ්ටි ප්‍රමාණයක් තිබිය යුතු ය. (මෙය එල්.බී. 29 අක්ෂි දෘෂ්ටි පරීක්ෂණයෙන් සමත් වීමට යටත්වය)

(iv) පිරිමි අයදුම්කරුවන් සඳහා පපුව අඟල් 32 ක් තිබිය යුතු ය.

(ආ) **අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව විෂයන් හයක් (06) සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව සමත් වී තිබීම.

(ඇ) **වයස:**

2026.09.28 දිනට අවම වයස් සීමාව අවුරුදු 18 නොඅඩු විය යුතු අතර උපරිම වයස් සීමාව අවුරුදු 28 නොවැඩි විය යුතුය. (ඒ අනුව 2008.09.28 දිනට හෝ ඊට පෙර හා 1997.09.29 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසු කම් ඇත.)

(ඈ) **වෙනත් -**

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
(ii) සියළුම අයදුම්කරුවන් අවිවාහක විය යුතු ය.
(iii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම
(iv) කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම තරඟ විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත.
(v) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත දක්වා ඇති සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**06. විභාග ගාස්තු:**

විභාග ගාස්තුව රු. 1200.00 කි. මෙම මුදල අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර දුම්රිය සාමාන්‍යාධිකාරීගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-100129027-313 ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට් පත අයදුම්පතේ අදාල කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.(රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

**07. අයදුම් කිරීමේ ක්‍රමය**

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය භාවිත කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පතේ ශීර්ෂ අංක 1.0 සිට 6.0 තෙක් පළවන පිටුවට ද, 7.0 සිට 12 (i) තෙක් එහි දෙවන පිටුවට ද, 12 (ii) සිට 14 (ඇ) තෙක් එහි තුන්වන පිටුවට ද, ඉතිරිය අනෙකුත් පිටුවලට ද වන පරිද්දෙන් තම අයදුම්පත සකස්කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද ? යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට ලදුපත අලවා ඇද්ද යන්න පිළිබඳව නැවත විමසිලිමත් විය යුතුය. තවද මේ පූර්ණ කරන ලද අයදුම්පතේ ජායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ජායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

(අ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(ආ) විභාගය සඳහා වන නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් 2026.09.28 දින හෝ ඊට පෙර හෝ ලැබෙනු පිණිස එවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ, වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි/කාන්තා) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026" යනුවෙන් ලිවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

**දුම්රිය සාමාන්‍යාධිකාරී,**
**පත්වීම් ශාඛාව,**
**දුම්රිය මූලස්ථානය,**
**ඕල්කට් මාවත,**
**තැ.පෙ. 355,**
**කොළඹ 10.**

(ඇ) අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඈ) අඩුපාඩු සහිත අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඉ) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ.

අයදුම්කරුවන් වෙත ලිඛිත විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත් පත් වල හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිළ වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම් කළ විභාගයේ නම් අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සටහන් කොට ඉල්ලීම් ලිපියක් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මඟින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායි වනු ඇත. තව ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත් තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානම්ව තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**08. විභාගයට පෙනී සිටීම -**

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රය ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවනු ඇත.

සටහන - අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

**09. අයදුම්කරුවන්ගේ අනන්‍යතාව -**

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රයක් පමණක් පිළිගනු ඇත.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

**10. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් -**

අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

**11.** මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් වලට යටත්ව ලේකම් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

**12. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය -**

(අ) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.
(ආ) අයදුම්කරු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ අධ්‍යාපන සුදුසුකම් ලබාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතු ය.

*සටහන :* (i) ඉහත (ආ) හි ඇති සුදුසුකම් යන පදයෙන් අදහස් කෙරෙන්නේ 5 (ආ) ඡේදයේ ඇති අධ්‍යාපන සුදුසුකම වේ.

(ii) අයදුම්කරුවකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකට ම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(iii) තම අයදුම්පතෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවකුට ඉඩ දෙනු නොලැබේ.

**13. බඳවා ගැනීමේ ක්‍රමය :-**

**13.1 ලිඛිත විභාගය**

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙක (02) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂය සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | 100 | 50 |
| 02. භාෂාව හැකියාව | 100 | 50 |

අයදුම්කරුවන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු ය.

**13.2 ලිඛිත විභාගයේ විෂය නිර්දේශය**

01. බුද්ධි පරීක්ෂණය

තර්කානුකූල විචාර බුද්ධිය, ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යාමය ගැටළු, ගණිත

ගැටළු, භාෂා ඛණ්ඩ, වගු, ගැලීම් සටහන්, පින්තූර හා ප්‍රස්ථාර උපයෝගී කර ගනිමින් බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. (කාලය පැය 01 යි)

02. භාෂා හැකියාව

නිවැරදිව හා පැහැදිලිව අදහස් ගොනු කිරීමේ හැකියාව, වර්තා ලිවීමේ හැකියාව, නිවැරදි ව්‍යාකරණ භාවිතය, තේරුම් ගැනීමේ හැකියාව හා කාර්යාලීය ලිපි ගණුදෙනු කිරීමේ හැකියාව මැන බැලීමේ ආකාරයෙන් සැකසුනු කෙටි පිළිතුරු සැපයීම, රචනා හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. (කාලය පැය 02යි)

**13.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

ලිඛිත විභාගයේ විෂයයන් දෙකෙන් එක් එක් විෂයට වෙන වෙනම ලකුණු 50% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ ඉහලම කුසලතා අනු පිළිවෙළට අවශ්‍ය සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ඇත. ලිඛිත විභාගයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු වල එකතුවේ වැඩිම ලකුණු අනු පිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පහත සඳහන් පරිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබා ගත හැකි උපරිම ලකුණු පනහ (50) කි.

| *අනු අංකය* | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ. |
| 02 | නායකත්ව හා වෙනත් ප්‍රජා සේවාවන් | 20 | |
| 03 | ක්‍රීඩා කුසලතා | 30 | |
| 04 | භාෂා දැනුම හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 25 | |
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය | 05 | |
| මුළු ලකුණු | | <u>100</u> | |

**13.4 එහි විස්තරාත්මක ලකුණු ලබා දීමේ පරිපාටිය පහත පරිදි වේ.**

**(i) අතිරේක අධයාපන සුදුසුකම් (ලකුණු 20)**

නියමිත අධ්‍යාපන සුදුසුකමට වැඩි අධ්‍යාපන සුදුසුකම් සඳහා උපරිම ලකුණු 20 කි.

1. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගෞරව උපාධියක් ලබා තිබීම - ලකුණු 20
2. පිළිගත් විශ්ව විද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම - ලකුණු 15
3. ඕනෑම විෂය ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් NVQ 04 හෝ ඊට ඉහළ සහතිකයක් ලබා තිබීම - ලකුණු 10
4. අ.පො.ස. (උ/පෙළ) විෂයයන් 03 ක් සමත්ව තිබීම - ලකුණු 05

**(ii) නායකත්ව හා වෙනත් ප්‍රජා සේවාවන් (ලකුණු 20)**

**(iii) ක්‍රීඩා කුසලතා**

**ක්‍රිකට් රගර් බොක්සිං, කරාටේ, ජිම්නාස්ටික්, මලල ක්‍රීඩා, ක්‍රීඩා** වලදී ලබා ඇති දක්ෂතා හෝ ශිෂ්‍ය භට පුහුණුව **පිළිබඳ සහතිකයක් තිබීම** යන දෙකෙන් එක් කරුණකට පමණක් උපරිම ලකුණු 15 ක් ප්‍රදානය කෙරේ.

| | | |
|---|---|---|
| ජාතික මට්ටමේ ප්‍රථම ස්ථානය | - | ලකුණු 30 |
| දිස්ත්‍රික් මට්ටමේ ප්‍රථම ස්ථානය | - | ලකුණු 30 |
| ප්‍රාදේශීය මට්ටමේ ප්‍රථම ස්ථානය | - | ලකුණු 10 |
| වෙනත් සහතික | - | ලකුණු 05 |

දෙවන හා තෙවන ස්ථාන වෙනුවෙන් අනුපාතිකව ලකුණු ලබා දෙනු ලැබේ.

**(iv) භාෂා දැනුම හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම (ලකුණු 25)**

**මෙම තරඟ විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබන ඉහත අනු අංක 05 හි (ආ) යටතේ සඳහන් භාෂා මාධ්‍යට අමතරව එහි සඳහන් අනිකුත් භාෂා මාධ්‍යයන් සඳහා අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරන සහතික සඳහා එක් භාෂාවකට ලකුණු 05 ක් වන සේ භාෂා දෙකම සඳහා ලකුණු 10 ක උපරිමයට යටත්ව ලකුණු ප්‍රදානය කෙරේ.**

**(iv) සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය (ලකුණු 05)**

***සැලකිය යුතුයි:-*** සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

**13.5** විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලික ප්‍රතිඵල දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිළ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පියවර ගනු ඇත.

**14.** සිංහල, දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**රවීන්ද්‍ර පත්මප්‍රිය,**
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2026 අගෝස්තු මස 11 වැනි දින,
දුම්රිය සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 355,
ඕල්කට් මාවත,
කොළඹ 10.

(මේ අනුව A-4 කඩදාසිවල දෙපසම භාවිත කරමින් පිළියෙල කරගත් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීමේ නිවේදනය කියවා හොඳින් වටහා ගත යුතු ය.)

**ආදර්ශ අයදුම්පත**

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි/ කාන්තා) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026**

**Open Competitive Examination for Recruitment to Railway Security (Male/ Female) of Railway Security Service in Sri Lanka Railway Department - 2026**

1.0 මාධ්‍ය
විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍ය ☐
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. සම්පූර්ණ නම :
   i. සිංහලෙන් /දෙමළෙන් : ______________________
   ii. ඉංග්‍රීසිකැපිටල් අකුරින්:______________________
   (උදා:HERATH MUDIYANSELAGE PIYAL SILVA)

03. මුලකුරු සමග නම :
   i. සිංහලෙන් /දෙමළෙන් : ______________________
   ii. ඉංග්‍රීසියෙන් :______________________

04. ස්ථිර ලිපිනය :
   i. සිංහලෙන් /දෙමළෙන් : ______________________
   ii. ඉංග්‍රීසියෙන් : ______________________

05. දුරකථන අංකය :
   I. ජංගම දුරකථන අංකය | | | | | | | | | | |
   II. කාර්යාලීය දුරකථනඅංකය | | | | | | | | | | |

06. ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | | | |

07. ස්ත්‍රී /පුරුෂ භාවය :

   ස්ත්‍රී 1
   පුරුෂ 0

   (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. විවාහක/ අවිවාහක බව :

   අවිවාහක 1
   විවාහක 0

   (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

09. පදිංචිය :

   i. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : __________ එහි අංකය :
   ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : __________
   iii. දිස්ත්‍රික්කය:__________

10. උපන් දිනය : වර්ෂය : | | | | | | මාසය : | | | දිනය : | | |

   2026.09.28 දිනට වයස : අවු: | | | මාස : | | | දින: | | |

11. දැනට සේවය කරන ආයතනය/දෙපාර්තමේන්තුව : ______________________

12. අධ්‍යාපන සුදුසුකම් :

i. අ.පො.ස. (සා.පෙළ) - පළමුවර
විභාග අංකය : ______________ වර්ෂය : ________

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| I. | | |
| II. | | |
| III. | | |
| IV. | | |
| V. | | |

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| VI. | | |
| VII. | | |
| VII. | | |
| IX. | | |
| X. | | |

ii. අ.පො.ස. (සා.පෙළ) - දෙවනවර

විභාග අංකය : ______________ වර්ෂය : ________

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| I. | | |
| II. | | |
| III. | | |
| IV. | | |
| V. | | |

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| VI. | | |
| VII. | | |
| VII. | | |
| IX. | | |
| X. | | |

13. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?:
(අදාළ කොටුව තුළ "×" ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

14. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සහ /හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හා තනතුර සඳහා තෝරා ගැනීමෙන් පසු ඉහත කරුණු අනාවරණය වුවහොත් තනතුර සඳහා කරන ලද පත්වීම අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවා ද මම පුද්ගලිකව දරා ගනිමි.

(ඇ) ................................ දින ...................................................... බැංකුවේ.................... ශාඛාවට රු.1200/=ක් ගෙවා ලබා ගත් මුදල් බැරපතෙහි මුල් පිටපත මේ සමඟ අමුණා ඇත.

| |
|---|
| බැරපත එහි එක්දාරයකින් නොගැලවෙන සේ අලවන්න<br>(බැරපතෙහි ඡායා පිටපතක් ලඟ තබා ගන්න.) |

(ඈ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඉ) තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

__________________,
අයදුම්කරුගේ අත්සන.

දිනය - ___________

15. අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරන.............................................................................................................. මහතා/මෙනවිය මම පුද්ගලිකව හඳුනමි. ඔහු ............................. දින ඉහත අත්සන මා ඉදිරිපිට දී තැබූ බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම බැරපත අලවා ඇති බවත් සහතික කරමි.

______________,
සහතික කරන අයගේ අත්සන.

දිනය : ___________

සහතික කරන අයගේ සම්පූර්ණ නම : ________________________________________
තනතුර : ______________________
ලිපිනය : ___________________________________________________________________
(කරුණාකර නිල මුද්‍රාව තබන්න).

16. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය:

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ...........................................................................................මහතා /මෙන විය...................……...................................................................දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ..................................... දින සිට ……………..………………………………දින දක්වා ....................................................................වශයෙන් සේවය කර ඇත. ඔහුට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වි නැත/ඇත. ඔහුගේ වැඩ,හැසිරීම හා පැමිණීම සතුටුදායකය/ අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් ,එම ලඳුපත අලවා ඇති බවත් , ඔහු දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි/ කාන්තා) III ශ්‍රේණිය සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන් / ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බවත් දන්වනු කැමැත්තෙමි.(අදාළ නොවන වචන කපා හරින්න)

___________________,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

දිනය : _________________
සහතික කරන අයගේ සම්පූර්ණ නම : ________________________________________
තනතුර : ______________________
ලිපිනය : ___________________________________________________________________
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)

08 - 310

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### මුදල් ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

2026 ජූලි මස 31 දිනැති අංක 2,500 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද "ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026" නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

I. ඉහත *ගැසට්* නිවේදනයේ අංක 7 (ඇ) වයස සම්බන්ද ඡේදය පහත පරිදි සංශෝධන වේ.

"2026.08.31 දිනට වයස අවුරුදු විසිදෙකට (22) නොඅඩු විය යුතු අතර, අවුරුදු තිස්පහට (35) නොවැඩි විය යුතු ය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2004.08.31 දින හෝ ඊට පෙර හා 1991.08.31 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස අවුරුදු 35 වේ. (රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතු ය.)

II. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.09.11 දක්වා දීර්ඝ කෙරේ. ඉහත ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් සියලුම කරුණු එලෙසම බල පවත්නා අතර සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනය ද 2026.08.31 දින ලෙස නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
මුදල් ක්‍රම සම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍යාංශය.

2026 අගෝස්තු මස 25 දින,
මුදල් ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
කොළඹ 01.

08 - 386

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

### ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ), ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (විද්‍යුත් ලේඛන හා අංකිතකරණය) හා ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය) තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) (පුරප්පාඩු ගණන 01යි), ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (විද්‍යුත් ලේඛන හා අංකිතකරණය) (පුරප්පාඩු ගණන 01යි) හා ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය) (පුරප්පාඩු ගණන 01යි) තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරඟ විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, 07, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ "විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ), ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (විද්‍යුත් ලේඛන හා අංකිතකරණය) හා ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2026" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. තව ද, විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය.

(*අ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026 සැප්තැම්බර් මස 25 දින වේ.

***සටහන :*** අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් ම විඳදරා ගත යුතු ය.

**2** තනතුරට අයත් කාර්යයන් :

I. ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ)

ලේඛන සංරක්ෂණය හා ප්‍රතිසංස්කරණය පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබාදීම, ලේඛන ප්‍රතිරූපනය පිළිබඳ උපදෙස් ලබාදීම, ලේඛන සංරක්ෂණයට යොදා ගන්නා ද්‍රව්‍ය පිළිබඳ තත්ත්ව පරීක්ෂාවන් ඉටු කිරීම,

ලේඛන සංරක්ෂණය හා ලේඛිත ප්‍රතිරූපනය පිළිබඳ ප්‍රමිති හඳුන්වා දීම, චිත්‍රපට සහ ශ්‍රව්‍ය දෘශ්‍ය තත්ත්ව පරීක්ෂාවන් ඉටු කිරීමට අවශ්‍ය තාක්ෂණික හා විද්‍යාත්මක නිරීක්ෂණ ලබාදීම, චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛනවල දිරාපත්වීම පිළිබඳ පර්යේෂණ සිදු කිරීමට සහය වීම, රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල ලේඛන සංරක්ෂණය හා ලේඛන ප්‍රතිරූපනය පිළිබඳ උපදෙස් ලබාදීම, පූර්ව සංරක්ෂණය, ලේඛන සංරක්ෂණය සහ ප්‍රතිසංස්කරණය පිළිබඳව රසායනික පර්යේෂණ සිදු කිරීම හා මගපෙන්වීම, යටත් නිලධාරීන් සඳහා වැඩ ඉලක්ක ලබාදීම හා ඔවුන්ගේ රාජකාරි අධීක්ෂණය, ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ (තාක්ෂණ, ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් ලේඛන) සහ ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන තනතුරට අදාළ අනෙකුත් කාර්යයන්.

II. ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (විද්‍යුත් ලේඛන හා අංකිතකරණය)

විද්‍යුත් ලේඛන උපචිත කර ගැනීම සඳහා අවශ්‍ය මෘදුකාංග හඳුනා ගැනීම හා උපචිත කිරීමට අවශ්‍ය මගපෙන්වීම් සියලු රාජ්‍ය ආයතන වෙත ලබා දීම, විද්‍යුත් අධිලේඛනාගාරයක් පවත්වාගෙන යාම හා ඒ සඳහා වන ප්‍රමිති ක්‍රියාගත කිරීම, උපචිත වන විද්‍යුත් ලේඛන දීර්ඝ කාලීනව පවත්වා ගැනීම සඳහා කාලීනව සුදුසු මාධ්‍යයන්ට මාරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම, ලේඛන අංකිත කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් හඳුන්වා දීම, යටත් නිලධාරීන් සඳහා වැඩ ඉලක්ක ලබාදීම හා ඔවුන්ගේ රාජකාරි අධීක්ෂණය, ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ (තාක්ෂණ, ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් ලේඛන) සහ ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන තනතුරට අදාළ අනෙකුත් කාර්යයන්.

III. ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය)

චිත්‍රපට සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන ආබද්ධ කර ගැනීම සහ එම තැන්පතුව කළමනාකරණය, එම ලේඛන හඳුනාගැනීම සහ විස්තර කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති ක්‍රියාගත කිරීම හා ඒ පිළිබඳව අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදීම, චිත්‍රපට සහ ශ්‍රව්‍ය දෘශ්‍ය අධිලේඛන පවත්වාගෙන යාම සහ එම ලේඛනවල සංරක්ෂණ සහ ප්‍රතිසංස්කරණ අවශ්‍යතාවන් හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන මහජනයාට ලබාදීමට අවශ්‍ය ආකෘති හඳුනාගැනීම, චිත්‍රපට සහ ශ්‍රව්‍ය දෘශ්‍ය අධිලේඛනවල අංකිතකරණය සඳහා අවශ්‍ය පරිගණක දෘඩාංග සහ මෘදුකාංග කාලීනව අවශ්‍ය ප්‍රමිතීන් අනුව හඳුනාගැනීම, යටත් නිලධාරීන් සඳහා වැඩ ඉලක්ක ලබාදීම හා ඔවුන්ගේ රාජකාරි අධීක්ෂණය, ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ (තාක්ෂණ, ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් ලේඛන) සහ ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන තනතුරට අදාළ අනෙකුත් කාර්යයන්.

**3.** සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට පත්වී වසර 03ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට 1වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

(iv) ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍ය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා දෙපාර්තමේන්තු ගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත්වේ.

**4** **වැටුප් පරිමාණය :**

මෙම තනතුරට 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL1-2025 රු. 82,150 - 10x2,400 – 8x2,940 – 17x3,900 - 195,970/- (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එහි උපලේඛන IIIහි සඳහන් පරිදි වේ.

**5.** අධ්‍යාපන සුදුසුකම් **:**

i. ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් ආයතනයකින්,
අධිලේඛන සංරක්ෂණය හෝ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම;

*හෝ*

අධිලේඛන සංරක්ෂණය හෝ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

2. අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂා විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ අ.පො.ස. (උ.පෙළ) ඉංග්‍රීසි/සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම හෝ උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම.

ii. ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (විද්‍යුත් ලේඛන හා අංකිතකරණය)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් ආයතනයකින්,
පරිගණක විද්‍යාව, පරිගණක හා ඉංජිනේරු තාක්ෂණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, තොරතුරු තාක්ෂණය යන විෂයයන්ගෙන් එක් විෂයයකින් විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම;

*හෝ*

පරිගණක විද්‍යාව, පරිගණක හා ඉංජිනේරු තාක්ෂණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, තොරතුරු තාක්ෂණය යන විෂයයන්ගෙන් එක් විෂයයකින් විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ පශ්චාත් උපාධියක් ලබා තිබීම

2. අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂා විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ අ.පො.ස. (උ.පෙළ) ඉංග්‍රීසි/සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම හෝ උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම.

iii. ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් ආයතනයකින්,
ශාස්ත්‍රවේදී, දෘශ්‍ය කලාවේදී, ලලිත කලාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම;

*හෝ*

ශාස්ත්‍රවේදී, දෘශ්‍ය කලාවේදී, ලලිත කලාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

2. අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂා විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ අ.පො.ස. (උ.පෙළ) ඉංග්‍රීසි/සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම හෝ උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම.

***සටහන :***
උපාධිය වලංගු වන දිනය අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හෝ ඊට පෙර දිනයක් විය යුතු ය.

**6 වයස් සීමාව** :

අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

**7 කායික සුදුසුකම්** :

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

**8 වෙනත් සුදුසුකම්:**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**9 බඳවාගැනීමේ ක්‍රමය :**

ලිඛිත විභාගයක් සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

ලිඛිත තරඟ විභාගයේ සියලු ම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට එම සෑම විෂයක් සඳහා ම ලකුණු 50% හෝ ඊට ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින්, ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 4 ගුණයක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ම මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

ලිඛිත විභාගයේ හා යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව තනතුරට බඳවාගනු ලැබේ.

කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල ම පිරවීම හෝ නොපිරවීම ද මෙම නිවේදනයේ සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

**10** ලිඛිත විභාගය :

10.1 මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලැබේ.

10.2 විෂය නිර්දේශය:

i. ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ)/ ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (විද්‍යුත් ලේඛන හා අංකිතකරණය) සහ ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය)

| *අංකය* | *විෂයයන්* | *විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවයන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙම ප්‍රශ්න පත්‍රයෙන් අපේක්ෂා කෙරේ. | පැය 01 | 100 | 50 |
| 02 | ඉංග්‍රීසි | ලිවීමේ කුසලතා<br>• අදාළ ක්ෂේත්‍රයේ නවීන ආකෘතීන් සහ ලිවීමේ ශෛලීන් පිළිබඳ දැනුම<br>• අභ්‍යන්තර සන්නිවේදන ක්‍රම<br>• විධිමත් ලිපි හුවමාරු හැකියාව<br>• විස්තර/පැහැදිලි කිරීම හා ලිවීම<br>• ව්‍යාකරණ<br>• සාරාංශ ලිවීමේ කුසලතා<br>• වාර්තා ලිවීමේ කුසලතා<br><br>අවබෝධය<br>• මුද්‍රිත පාඨයක් තේරුම් ගැනීමට, අර්ථය අනුමාන කිරීමට සහ ලිඛිත අර්ථ නිරූපණය කිරීමට අපේක්ෂකයින්ට ඇති හැකියාව අපේක්ෂා කෙරේ.<br>• මුද්‍රිත පාඨයක නිශ්චිත හා සාමාන්‍ය අර්ථය කියවීම සහ තේරුම් ගැනීම<br><br>පරිවර්තන කුසලතා<br>• ලබා දී ඇති පාඨයක් එහි අර්ථය නොවෙනස්වන පරිදි එක් භාෂාවක සිට තවත් භාෂාවක් සඳහා පරිවර්තනය | පැය 02 | 100 | 50 |

**11. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගෙන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

**i. ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ)**

| *අනු. අංකය* | *ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් :<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් ආයතනයකින් ලබාගත් රසායන විද්‍යාව, ව්‍යාපෘති කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධියක්<br><br>1. පර්යේෂණ පාදක<br>2. පාඨමාලා පාදක<br><br>(මූලික අධ්‍යාපන සුදුසුකමකට අමතර වශයෙන් ලබාගෙන ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | <br><br><br><br><br><br>15<br>10 | 15 |
| 02 | ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය සුදුසුකම් :<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදාන ආයතනයකින් හෝ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සංස්කෘතික හා ඓතිහාසික වටිනාකමක් ඇති අයිතම සංරක්ෂණය, සංරක්ෂණ විද්‍යාව, අධිලේඛන කළමනාකරණය, ලේඛන කළමනාකරණය, තොරතුරු විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයකට (මූලික සුදුසුකම්වලට අමතර වශයෙන්)<br><br>1. පශ්චාත් උපාධියක් හදාරා තිබීම<br>2. පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා තිබීම<br>3. උපාධියක් හදාරා තිබීම<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මෙරට හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් හෝ මෙරට හෝ විදේශීය උපාධි ප්‍රදාන ආයතනයකින් හෝ අධිලේඛන කළමනාකරණය හා සම්බන්ධ මෙරට හෝ විදේශීය ආයතනයකින් හෝ පිළිගත් සංවිධානයකින් ලබාගත් සංස්කෘතික සහ ඓතිහාසික වටිනාකමක් ඇති අයිතම සංරක්ෂණය, සංරක්ෂණ විද්‍යාව, අධිලේඛන කළමනාකරණය, ලේඛන කළමනාකරණය, තොරතුරු විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයකට (මූලික සුදුසුකම්වලට අමතර වශයෙන්)<br><br>1. ඩිප්ලෝමාවක් හදාරා තිබීම<br>2. සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (අවම පැය 36ක) | <br><br><br><br><br><br><br><br>15<br>10<br>08<br><br><br><br><br><br><br><br><br>04<br>02 | 15 |
| 03 | ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද :<br><br>සංස්කෘතික සහ ඓතිහාසික වටිනාකමක් ඇති අයිතම සංරක්ෂණය, සංරක්ෂණ විද්‍යාව, අධිලේඛන කළමනාකරණය, ලේඛන කළමනාකරණය, තොරතුරු කළමනාකරණය යන ක්ෂේත්‍රයන්ගෙන් එක් ක්ෂේත්‍රයක හෝ මූලික වගකීම දරා ඇති තනතුරක සේවා පළපුරුද්ද එක් වර්ෂයකට ලකුණු 03 බැගින් (අදාළ ආයතන ප්‍රධානියා විසින් නිකුත් කළ සේවා සහතික ඉදිරිපත් කළ යුතුය. මෙම සහතිකයේ සේවය ආරම්භ කළ/ අවසාන වූ දින නිශ්චිතව සඳහන් විය යුතු අතර, අයදුම්කරු තවදුරටත් සේවයේ නිරත වේ නම් ඒ බව ද පැහැදිලිව සඳහන් විය යුතු ය.) | 15 | 15 |

| අනු. අංකය | ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 04 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය :<br><br>i. තනතුරෙහි භූමිකාව ඉටුකිරීමට ආධාර වන අයදුම්කරුගේ ශක්තීන් (strengths questions)<br>ii. අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව (situational questions)<br>iii. දක්ෂතාව (competency questions)<br><br>යන කරුණු ඇගයීමට ලක් කිරීම අරමුණු කර ගත් ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | <br><br>01<br><br>01<br>03 | 05 |
| | **එකතුව** | | **50** |

**ii. ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (විද්‍යුත් ලේඛන හා අංකිතකරණය) :**

| අනු. අංකය | ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :**<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, තොරතුරු තාක්ෂණය, මෘදුකාංග ඉංජිනේරු, ව්‍යාපෘති කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධියක්<br>1. පර්යේෂණ පාදක<br>2. පාඨමාලා පාදක<br>(මූලික අධ්‍යාපන සුදුසුකමකට අමතර වශයෙන් ලබාගෙන ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | <br><br><br><br><br><br><br><br>15<br>10 | 15 |
| 02 | **ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය සුදුසුකම්:**<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදාන ආයතනයකින් හෝ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ඩිජිටල් පුස්තකාල කළමනාකරණය, ඩිජිටල් ලේඛන කළමනාකරණය, ඩිජිටල් ලේඛන සංරක්ෂණය, අධිලේඛන කළමනාකරණය, ලේඛන කළමනාකරණය, තොරතුරු විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයකට (මූලික සුදුසුකම්වලට අමතර වශයෙන්)<br><br>1. පශ්චාත් උපාධියක් හදාරා තිබීම<br>2. පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා තිබීම<br>3. උපාධියක් හදාරා තිබීම<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මෙරට හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් හෝ මෙරට හෝ විදේශීය උපාධි ප්‍රදාන ආයතනයකින් හෝ අධිලේඛන කළමනාකරණය හා සම්බන්ධ මෙරට හෝ විදේශීය ආයතනයකින් හෝ පිළිගත් සංවිධානයකින් ලබාගත් ඩිජිටල් පුස්තකාල කළමනාකරණය, ඩිජිටල් ලේඛන කළමනාකරණය, ඩිජිටල් ලේඛන සංරක්ෂණය, අධිලේඛන කළමනාකරණය, ලේඛන කළමනාකරණය, තොරතුරු විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයකට (මූලික සුදුසුකම්වලට අමතර වශයෙන්)<br>1. ඩිප්ලෝමාවක් හදාරා තිබීම<br>2. සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (අවම පැය 36ක) | <br><br><br><br><br><br><br>15<br>10<br>08<br><br><br><br><br><br><br><br><br><br><br>04<br>02 | 15 |

| අනු. අංකය | ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 03 | **ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද :** | | 15 |
| | i. පරිගණක මෘදුකාංග නිර්මාණය කිරීමේ පළපුරුද්ද<br>එක් මෘදුකාංගයක් සඳහා ලකුණු 05 බැගින් (ප්‍රකාශන හිමිකම් සහතිකය හෝ පේටන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතු ය.) | 15 | |
| | ii. පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, තොරතුරු තාක්ෂණය, මෘදුකාංග ඉංජිනේරු, ඩිජිටල් පුස්තකාල කළමනාකරණය, ඩිජිටල් ලේඛන කළමනාකරණය, ඩිජිටල් ලේඛන සංරක්ෂණය, අධිලේඛන කළමනාකරණය, ලේඛන කළමනාකරණය, තොරතුරු කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි එක් ක්ෂේත්‍රයක හෝ මූලික වගකීම දරා ඇති තනතුරක සේවා පළපුරුද්ද එක් වර්ෂයකට ලකුණු 03 බැගින් (අදාළ ආයතන ප්‍රධානියා විසින් නිකුත් කළ සේවා සහතික ඉදිරිපත් කළ යුතුය. මෙම සහතිකයේ සේවය ආරම්භ කළ/ අවසාන වූ දින නිශ්චිතව සඳහන් විය යුතු අතර, අයදුම්කරු තවදුරටත් සේවයේ නිරත වේ නම් ඒ බව ද පැහැදිලිව සඳහන් විය යුතු ය.)<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ) | 15 | |
| 04 | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය :** | | 05 |
| | i. තනතුරෙහි භූමිකාව ඉටුකිරීමට ආධාර වන අයදුම්කරුගේ ශක්තීන් (strengths questions) | 01 | |
| | ii. අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව (situational questions) | 01 | |
| | iii. දක්ෂතාව (competency questions) | 03 | |
| | iv. | | |
| | යන කරුණු ඇගයීමට ලක් කිරීම අරමුණු කර ගත් ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | | |
| | **එකතුව** | | **50** |

**iii. ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය)**

| අනු. අංකය | ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් : | | 15 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් ආයතනයකින් ලබා ගත් ශාස්ත්‍රවේදි, දෘශ්‍ය කලාවේදි, ලලිත කලාවේදී, ව්‍යාපෘති කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධියක් | | |
| | 1. පර්යේෂණ පාදක | 15 | |
| | 2. පාඨමාලා පාදක | 10 | |
| | (මූලික අධ්‍යාපන සුදුසුකමකට අමතර වශයෙන් ලබාගෙන ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | | |

| *අනු. අංකය* | *ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 02 | ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය සුදුසුකම් :<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදාන ආයතනයකින් ලබාගත් තොරතුරු විද්‍යාව, ලේඛන කළමනාකරණය, අධිලේඛන කළමනාකරණය, ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂණය යන විෂයයන්ගෙන් එක් විෂයයකට (මූලික සුදුසුකම්වලට අමතර වශයෙන්)<br><br>1. පශ්චාත් උපාධියක් හදාරා තිබීම<br>2. පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා තිබීම<br>3. උපාධියක් හදාරා තිබීම<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මෙරට හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් හෝ මෙරට හෝ විදේශීය උපාධි ප්‍රදාන ආයතනයකින් හෝ අධිලේඛන කළමනාකරණය හා සම්බන්ධ මෙරට හෝ විදේශීය ආයතනයකින් හෝ පිළිගත් සංවිධානයකින් ලබාගත් තොරතුරු විද්‍යාව, ලේඛන කළමනාකරණය, අධිලේඛන කළමනාකරණය, ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂණය යන විෂයයන්ගෙන් එක් විෂයයකට (මූලික සුදුසුකම්වලට අමතර වශයෙන්)<br><br>1. ඩිප්ලෝමාවක් හදාරා තිබීම<br>2. සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (අවම පැය 36ක) | <br><br><br><br><br><br>15<br>10<br>08<br><br><br><br><br><br><br><br>04<br>02 | 15 |
| 03 | ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද :<br><br>ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂණය, තොරතුරු කළමනාකරණය, ලේඛන කළමනාකරණය, අධිලේඛන කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හී එක් ක්ෂේත්‍රයක හෝ මූලික වගකීම දරා ඇති තනතුරක සේවා පළපුරුද්ද එක් වර්ෂයකට ලකුණු 03 බැගින් (අදාළ ආයතන ප්‍රධානියා විසින් නිකුත් කළ සේවා සහතික ඉදිරිපත් කළ යුතු ය. මෙම සහතිකයේ සේවය ආරම්භ කළ සහ අවසාන වූ දින නිශ්චිතව සඳහන් විය යුතු අතර, අයදුම්කරු තවදුරටත් සේවයේ නිරත වේ නම් ඒ බව ද පැහැදිලිව සඳහන් විය යුතු ය.) | 15 | 15 |
| 04 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය :<br><br>i. තනතුරෙහි භූමිකාව ඉටුකිරීමට ආධාර වන අයදුම්කරුගේ ශක්තීන් (strengths questions)<br>ii. අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව (situational questions)<br>iii. දක්ෂතාව (competency questions)<br><br>යන කරුණු ඇගයීමට ලක් කිරීම අරමුණු කර ගත් ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | <br><br>01<br><br>01<br>03 | 05 |
| | එකතුව | | 50 |

***සැලකිය යුතුයි:***

යෝග්‍යතා සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

**12 විභාග කොන්දේසි :**

I. විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරු කැමති එක් භාෂාවකින් මෙම විභාගයේ සියලු ම ප්‍රශ්නපත්‍රවලට පිළිතුරු සැපයිය යුතු ය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

II. විභාග ගාස්තු රු.1200කි. තවද එම විභාග ගාස්තුව "ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්" නමින් මහජන බැංකුව තිඹිරිගස්යාය ශාඛාවේ පවතින බැංකු ගිණුම් අංක 086-1001-3902-6218යට බැරකොට අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත එහි එක් දාරයක් මඟින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමක් සිදු නොකෙරේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

III. මෙම විභාගය කොළඹ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

IV. අසම්පූර්ණ අයදුම්පත් මෙන් ම මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

V. ඉල්ලුම්පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. 01 සිට 06 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 07 සිට 08 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද, ඉතිරිය 3 පිටුවලට ද වන ලෙස ගෙන සකස්කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.

VI. අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවියේ (www.slida.lk) පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග ශාඛාවේ දුරකථන අංක 011-5980264 හෝ 011-5980255 ඔස්සේ සතියේ වැඩකරන දිනයන් හී පෙ.ව. 8.30 සිට ප.ව.4.00 දක්වා විමසිය හැකිය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. එසේ විමසීමේ දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එසේම විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ සියලු ම විභාග අපේක්ෂකයන්ට ඒ බව දන්වා කෙටි පණිවිඩයක් (SMS) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් යොමු කරනු ඇත.

VII. රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතු ය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙකු ම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවෙකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා ද සහතික කරවා ගත යුතුය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු/ විශ්‍රාමික ප්‍රධානියෙකු/ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිළධාරියෙකු/ රු.240,360/-ක් හෝ ඊට වඩා වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙක් හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

VIII. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

**13 විභාගයට ඇතුළත් වීම :**

I. සෑම ආකාරයෙන් ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

II. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතු ය.

***සටහන -*** අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

III. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

IV. එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාවය තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා කන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා කන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**14. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ.

**15.** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**16.** සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**17.** මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

**18. විභාග ප්‍රතිඵල :**

අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම් දීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තැපැලෙන් හෝ වෙබ් අඩවිය මඟින් සිදු කෙරෙනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික
කටයුතු අමාත්‍යාංශය.

2026 අගෝස්තු මස 28 වන දින.

**ආදර්ශ අයදුම්පත**

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ), ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (විද්‍යුත් ලේඛන හා අංකිතකරණය) හා ජාතික ලේඛනාගාර සහකාර අධ්‍යක්ෂ (චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය) තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

**Open Competitive Examination for the Recruitment to the Grade III posts of National Archives Assistant Director (Technical), National Archives Assistant Director (Electronic Records & Digitization), National Archives Assistant Director (Films & Audio Visual) in the Department of National Archives - 2026**

විභාගයට පෙනී සිටින මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ කොටුව තුළ ලියන්න.)

අයදුම් කරන තනතුර/ තනතුරු :

| *තේරීම* | *තනතුරු අංකය* |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

(*ගැසට්* නිවේදනයේ 02 ඡේදයට අනුව අංක යොදන්න.)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................
(උදා: HERATH MUDIYANSELAGE SAMAN ….....................................................................
KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................
(උදා: GUNAWARDHANA, H.M.S.K.) ......................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :….......................................................................
….......................................................................

02. 2.1 ස්ථිර පදිංචි ලිපිනය :….......................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ….......................................................................

2.2 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :….......................................................................
….......................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

04. ස්ත්‍රී/ පුරුෂ භාවය : ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) පුරුෂ - 0

| |
|---|
| |

05. උපන් දිනය :

(අ) වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස

අවුරුදු : ☐☐ මාස: ☐☐ දින: ☐☐

06. 6.1 ජංගම දුරකථන අංකය : | | | | | | | | | | | | |

6.2 විද්‍යුත් තැපැල් ලිපිනය :...........................................................................

07. අධ්‍යාපන සුදුසුකම් :

*(අ)* i. පශ්චාත් උපාධිය : ...........................................................................
ii. විශ්වවිද්‍යාලය/ආයතනය : ...........................................................................
iii. ලියාපදිංචි අංකය : ...........................................................................
iv. උපාධිය වලංගු දිනය : ...........................................................................

*(ආ)* i. සාමාන්‍ය උපාධිය : ...........................................................................
ii. විශ්වවිද්‍යාලය/ආයතනය : ...........................................................................
iii. ලියාපදිංචි අංකය : ...........................................................................
iv. උපාධිය වලංගු දිනය : ...........................................................................

(ඇ) අ.පො.ස (උ/පෙළ) :

විභාගයේ වර්ෂය :

විභාග අංකය :

| *විෂයයන්* | *සාමාර්ථය* | *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |

(ඇ) අ.පො.ස (සා/පෙළ)

විභාගයේ වර්ෂය :

විභාග අංකය :

| ***විෂයයන්*** | *සාමාර්ථය* | ***විෂයයන්*** | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

08. විභාග ගාස්තුව (ලදුපත අමුණා එවිය යුතු ය.)
i. ගෙවන ලද බැංකුව : .....................................................................
ii. ගෙවූ මුදල : .....................................................................
iii. ගෙවූ දිනය : .....................................................................
iv. ලදුපතේ අංකය : .....................................................................

*ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.*

*(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)*

09. අයදුම්කරුගේ ප්‍රකාශය/ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව, ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මා දැන සිටිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.................................................... ............................................
දිනය අත්සන

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : **(අදාළ නොවන වචන කපා හරින්න.)**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................ නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය ................................. මස ..................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන : ........................................................................................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම : ........................................................................................
තනතුර : ........................................................................................
ලිපිනය : ........................................................................................
(නිල මුද්‍රාව)
දිනය : ..........................................................

*සටහන :* අයදුම්පත සහතික කළයුත්තේ ගැසට් නිවේදනයේ 12ඡේදයේ (VII) වගන්තියේ සඳහන් පරිදි ය.

11. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය : **(රාජ්‍ය ආයතනයකින් ඉදිරිපත් වන අයදුම්කරුවන් සඳහා පමණි)**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................... නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයකු වන අතර, ඔහු/ ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය.

..................................................... නිල මුද්‍රාව :
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය : .......................................

ආයතන ප්‍රධානියාගේ නම : ..........................................................................
තනතුර : ..........................................................................
සේවා ස්ථානයේ ලිපිනය : ..........................................................................

08 - 384

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

වෘත්තීය අධ්‍යාපන අංශය

**ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය**

මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත (Japan Tec)

*ආධුනිකයින් බඳවා ගැනීම - 2027 වසර*

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන ජපන් - ශ්‍රී ලංකා මිත්‍රත්වය මත ජපන් රජය මගින් ප්‍රදානය වූ මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පවත්වනු ලබන පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2027 වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම පිණිස වයස අවුරුදු 16 ට නොඅඩු 25 ට නොවැඩි ශ්‍රී ලාංකික ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අඩු ආදායම්ලාභී/අස්වැසුම්ලාභී පවුල්වල තෝරාගත් ආධුනිකයින්ට ශිෂ්‍යත්ව ලබාදීමට කටයුතු කරනු ලැබේ. විශේෂ අවශ්‍යතා සහිත (ශ්‍රවණ හා කථන අබාධ සහිත) ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයට අංක 1.2.1.4, 1.5, 1.6, 1.7 දරන පාඨමාලා සඳහා පමණක් අයදුම්කළ හැකි ය.

**1. අයදුම්පත් කැඳවනු ලබන පූර්ණ කාලීන පාඨමාලා :**

| 1 | *පූර්ණ කාලීන පාඨමාලා* | *කාලය* | *පාඨමාලා ගාස්තු (දිවා) ** | *බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1.1 | මෝටර් රථ තාක්ෂණ ශිල්පS - Automobile Technician | අවු. 03 | රු.200,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. |
| 1.2 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී - Automobile Electrician | අවු. 03 | රු.200,000 | |
| 1.3 | යන්ත්‍ර ශිල්පී - Machinist / CNC | අවු. 03 | රු.170,000 | |
| 1.4 | මෝටර් රථ වායු සමීකරණ තාක්ෂණ ශිල්පී Automobile A/C Technician | අවු. 02 | රු.70,000 | |
| 1.5 | මෝටර් රථ ටින්කර් ශිල්පී - Automobile Tinker | අවු. 1 ½ | රු.30,000 | රජයේ හෝ රජය විසින් පිලිගන්නා ලද පාසලක 8 වන ශ්‍රේණිය සමත්වී තිබීම. |
| 1.6 | මෝටර් රථ පින්තාරු ශිල්පී - Automobile Painter | අවු. 1 ½ | රු.30,000 | |
| 1.7 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී - ICT Technician | අවු. 1 | රු.40,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. |

* පූර්ණ කාලීන දිවා පාඨමාලා සඳහා ආධුනිකයින් බඳවා ගැනීමෙන් පසු ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාවය මත අයදුම්කරුවන් අතරින් සීමිත සිසුන් පිරිසක් සඳහා සන්ධ්‍යා කාලීන පාඨමාලා ආරම්භ කෙරෙන අතර ඒ සඳහා 50% ක අමතර පාඨමාලා ගාස්තුවක් අයකෙරේ

**2. වයස :**

2027.01.01 දිනට වයස අවුරුදු 16 ට නොඅඩු සහ 25 ට නොවැඩි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයටම අයදුම්කළ හැකිය.

**3. පාඨමාලා පුහුණු විස්තර :**

3.1 ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව (NVQ) යටතේ වූ නිපුණතා පාදක පුහුණුවට අනුව ද්විත්ව පුහුණු ක්‍රමවේදය ඔස්සේ සියලුම පාඨමාලා පැවැත්වේ.

3.2 ඒ අනුව 1.1 සිට 1.3 දක්වා වූ පාඨමාලාවල පළමු වසරේ ආයතනික පුහුණුව ලබාදෙන අතර එහි දී ලබාගත් න්‍යායික/ප්‍රායෝගික දැනුම, කුසලතාවය සහ ආකල්ප වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ දෙවන හා තුන්වන වසර කර්මාන්තගත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හෝ නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ ආයතනවලට අනුයුක්ත කරනු ලැබේ.

3.3 1.3 පාඨමාලාවේ සී එන් සී (CNC) ප්‍රෝගැමින්, කැම් (CAM) ප්‍රෝගැමින්, ලේත් මැෂිනින් ඇතුලු මූලික යන්ත්‍රවලට අමතරව මෝටර් රථ ඉංජිනේරු ක්ෂේත්‍රයට අයත් හෙඩ් ෆේසින්, බෝරිං, හෝනින්, ක්‍රෑන්ක් ග්‍රයින්ඩින් සහ වූල් කටර් ග්‍රයින්ඩින් යන සියලුම
යන්ත්‍රවල පුහුණුව ඇතුලත්ව 3.2 හි සඳහන් පරිදි පුහුණු කෙරේ.

3.4 1.4 පාඨමාලාව සඳහා පුහුණුවේ පළමු වසරේ ආයතනික පුහුණුව ලබාදෙන අතර එහිදී ලබාගත් න්‍යායික/ප්‍රායෝගික දැනුම, කුසලතාවය සහ ආකල්ප වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ ඉතිරි වසර කර්මාන්තගත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හෝ නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ ආයතනවලට අනුයුක්ත කරනු ලැබේ.

3.5 1.5 සිට 1.6 පාඨමාලා සඳහා පුහුණුවේ පළමු මාස 06 ආයතනික පුහුණුව ලබාදෙන අතර එහි දී ලබාගත් න්‍යායික/ප්‍රායෝගික දැනුම, කුසලතාවය සහ ආකල්ප වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ ඉතිරි වසර කර්මාන්තගත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හෝ නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ ආයතනවලට අනුයුක්ත කරනු ලැබේ.

3.2 1.7 පාඨමාලාව සඳහා පුහුණුවේ පළමු මාස 06 ආයතනික පුහුණුව ලබාදෙන අතර එහි දී ලබාගත් න්‍යායික/ප්‍රායෝගික දැනුම, කුසලතාවය සහ ආකල්ප වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ ඉතිරි වසර කර්මාන්තගත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හෝ නොවන ආයතනවලට අනුයුක්ත කරනු ලැබේ.

**4. පාඨමාලා කාලය තුල ලබාදෙන ප්‍රතිලාභ**

4.1 සියලුම ආධුනිකයින්ට පුහුණුවේ නිරතවීමට වැඩහල් නිල ඇඳුමක්
4.2 තෝරාගනු ලබන ආර්ථික අපහසුතාවයන් ඇති ආධුනිකයින්ට නිපුණතා සිසු සවිය දීමනා
4.3 පාඨමාලා කාලය තුල ඉංග්‍රීසි භාෂාව / පරිගණක දැනුම
4.4 පුස්තකාල පහසුකම්/ආපන ශාලා පහසුකම්
4.5 ශ්‍රීලංගම බස්රථ සඳහා වාර ප්‍රවේශපත්‍ර සහන මිලට

5. ආධුනිකත්ව ගිවිසුම :

තෝරා ගනු ලබන සෑම ආධුනිකයෙකු විසින්ම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය සමඟ ආධුනිකත්ව ගිවිසුමකට එළඹිය යුතු ය. ආයතනයේ විනය නීති රීති වලට අනුව සතුටුදායක ලෙස පාඨමාලාව අවසන් කිරීමට අපොහොසත් වුවහොත් ආධුනිකත්ව ගිවිසුම අවලංගු කරනු ලැබේ.

6. සහතිකපත් ප්‍රදානය :

සාර්ථක ලෙස පුහුණුව අවසන් කර අවසාන ඇගයීම් පරීක්ෂණයන්ගෙන් සමත්වන ආධුනිකයින්ට මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සහතිකය සමග තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිරිනමන ජාත්‍යන්තරව පිලිගත් "ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ සහතිකය" (NVQ Level 4) ප්‍රදානය කරනු ලබයි.

7. පාඨමාලා සඳහා තෝරා ගැනීම :

බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් සපුරාලන සියලුම අයදුම්කරුවන් ගණිතය සහ සාමාන්‍ය දැනීම ඇතුළත් පැය 01 ක අභියෝග්‍යතා ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර ඉන් ලබා ගත් ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවා තෝරා ගැනීම සිදුකරනු ලබයි. (ලිඛිත පරීක්ෂණයට සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනීසිටිය හැකි අතර අධ්‍යයන කටයුතු සිදුකරනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි)

8. අයදුම්පත් එවිය යුතු ආකාරය :

- ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පතෙහි පසුපිටෙහි මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ දෙමටගොඩ මහජන බැංකු ශාඛාවේ ගිණුම් අංක 071100103320674 දරන ගිණුමට විභාග ගාස්තු ලෙස රු.1000.00 ක් බැර කර ලබාගත් ලදු පත

ඇලවිය යුතු ය. (මාර්ගගත ක්‍රමයට හෝ CDM ක්‍රමයට කරන ලද ගෙවීම් වලංගු නොවන අතර ලදුපතෙහි තැන්පත්කරුගේ නම සහ හැඳුනුම්පත් අංකය සඳහන් විය යුතු ය)

- සම්පූර්ණ කරන ලද අයදුම්පත ඔබගේ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් සමග 2026 සැප්තැම්බර් මස 30 දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ/විදුහල්පති, මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 69/A, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙලවරේ “ආධුනිකයින් බඳවා ගැනීම - 2027” යනුවෙන් සඳහන් කළ යුතු ය. අප ආයතනයට පැමිණ ද ඉල්ලුම්පත් නොමිලේ ලබාගත හැක. *නැතහොත්* aeti.naita.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස් :-

- අයදුම්කරුගේ අභිමතය පරිදි, ප්‍රමුඛතාවය ලබාදෙමින් පාඨමාලා තුනක් අයදුම්පතේ 10 වන ඡේදයේ සඳහන් කර අයදුම්කළ හැකි අතර දෙවන සහ තෙවන අභිමතය සඳහා තෝරාගනු ලබන්නේ සඳහන් කර ඇති අනුපිළිවෙල අනුව ඒ ඒ පාඨමාලා සඳහා ඇබෑර්තු ඇත්නම් පමණි.
- ලියාපදිංචි තැපෑලෙන් පමණක් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලබන අතර නිවැරදි ලෙස ලිපිනය අයදුම්පතේ සඳහන් කළ යුතු ය.
- විභාග ගාස්තු ගෙවන ලද ලදුපත නිසි ලෙස අයදුම්පතේ ඇලවිය යුතු ය. (ගෙවන ලද විභාග ගාස්තු කිසිලෙසකින්වත් ආපසු ලබා නොදේ)
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පූර්ණ කාලීන පුහුණුව ලබමින් සිටින අයට අයදුම් කළ නොහැක.
- තැපෑලේ දී අස්ථානගතවන හෝ ප්‍රමාදවන අයදුම්පත් වලට මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය වග නොකියන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් කල් ඇතුව එවන මෙන් දන්වා සිටිනු ලැබේ.
- වැඩිදුර තොරතුරු සඳහා ලේඛකාධිකාරී, දුරකථන අංක - 011-2572977 හෝ 011-2531844 විමසන්න.

සභාපති,

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

වෘත්තීය අධ්‍යාපන අංශය

**ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය**

මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත

*ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත - 2027 වර්ෂය*

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

01. මුලකුරු සමග නම :

02.

| ස්ත්‍රී | පුරුෂ |
|---|---|
| | |

03. සම්පූර්ණ නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| 04. උපන් දිනය | වර්ෂය | මාසය | දිනය |
|---|---|---|---|
| | | | |

05. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

| | |
|---|---|
| 06. ලිපිනය :<br>(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)<br><br>දුරකථන අංකය : ජංගම :<br>ස්ථාවර :<br><br>වට්ස්ඇප් අංකය :<br>(දුරකථන අංකය :<br>(දුරකථන අංකය අනිවාර්යයෙන් සඳහන් කරන්න) | 07. පරිපාලන දිස්ත්‍රික්කය<br><br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br><br>ග්‍රාම නිලධාරී කොට්ඨාසය |

08. අධ්‍යාපන සුදුසුකම් ( ලබා ඇති උසස්ම සුදුසුකම් x ලකුණ යොදන්න)

| 8 වන ශ්‍රේණිය | අ.පො.ස (සා.පෙ) | අ.පො.ස (උ.පෙ) |
|---|---|---|

09. අ.පො.ස (සා.පෙ) විභාග ප්‍රතිඵල :

| | *විෂයය* | *සාමාර්ථය* | *වර්ෂය* | | *විෂයය* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | 8 | | | |
| 2 | | | | 9 | | | |
| 3 | | | | 10 | | | |
| 4 | | | | 11 | | | |
| 5 | | | | 12 | | | |
| 6 | | | | 13 | | | |
| 7 | | | | 14 | | | |

අ.පො.ස (උ.පෙ) විභාග ප්‍රතිඵල

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | 3 | | | |
| 2 | | | | | 4 | | | |

10. තෝරා ගනු ලබන පාඨමාලාවන් පුමුඛතාවය අනුව පිළිවෙලින්

| |
|---|
| 1 |
| 2 |
| 3 |

11. විභාගයට පෙනී සිටීමට කැමැති මාධ්‍ය x ලකුණ යොදන්න සිංහල ☐ ඉංග්‍රීසි ☐

12. විශේෂ අවශ්‍යතා සහිත (කථන හෝ ශ්‍රවණාබාධ සහිත) අයදුම්කරුවන් x ලකුණ යොදන්න ☐

ඉහත සඳහන් කරුණු නිවැරදි බවත්, සත්‍ය බවත් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුවක් මා නොලබන බවත්, මෙයින් සහතික කරන අතර මෙහි දක්වා ඇති කරුණු අසත්‍ය බවට අනාවරණය වුවහොත්, මම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පාඨමාලාව හැදෑරීම සඳහා නුසුදුස්සෙකු වන බවත් හොඳාකාරව දනිමි.

දිනය :.............................. ....................................,

අයදුම්කරුගේ අත්සන.

08 - 323

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.